رئاسة الشؤون الدينية
بالمسجد الحرام والمسجد النبوي

# හජ් ඉටුකරන ක්‍රමය

සිංහල | سنهالي | صفة الحج

ගරු ආචාර්ය:
මුහම්මද් බින් සාලිහ් අල් උසයිමීන්ගේ පන්හිදෙන්

# صِفَةُ الْحَجِّ

# හජ් ඉටුකරන ක්‍රමය

لِفَضِيلَةِ الشَّيْخِ العَلَّامَةِ مُحَمَّدِ بْنِ صَالِحٍ العُثَيْمِينِ

غَفَرَ اللَّهُ لَهُ وَلِوَالِدَيْهِ وَلِلمُسْلِمِينَ

**ගරු ආචාර්ය:**

මුහම්මද් බින් සාලිහ් අල් උසයිමීන්ගේ පත්හිදෙන්

# හජ් ඉටුකරන ක්‍රමය

එතුමාට, එතුමාගේ මව්පියන්ට සහ සියලු මුස්ලිම්වරුන්ට අල්ලාහ් සමාව පිරිනමන සේක්වා!

සර්ව ලෝකයන්හි පරමාධිපතියාණන් වන අල්ලාහ්ට ම සියලු ප්‍රශංසා, අපගේ නබිවරයාණන් වන මුහම්මද් තුමාණන් හටත් එතුමාණන්ගේ පවුලේ ඥාතීන් හා හිතමිතුරන් සියලු දෙනා හටත් ශාන්තිය හා සමාදානය මම පතමි.

වර්තමානයට ගැළපෙන පරිදි හජ් පිළිබඳ කරුණු කිහිපයක් සරල ව මාගේ සහෝදරයින් වෙත ඉදිරිපත් කිරීමට මම ප්‍රිය කරමි. එය සියලු ක්‍රියාවන් අල්ලාහ් වෙනුවෙන් අවංක ව සිදු කිරීමේ හා අන් අයට ප්‍රයෝජනවත් වීමේ අපේක්ෂාවෙනි. එමෙන් ම ඔහු වෙත සමීප වීමේ බලාපොරොත්තුවෙනි. සැබැවින් ම ඔහු ධානපති ය ත්‍යාගශීලී ය.

**හජ් පිළිබඳ සාකච්ඡාව පහත පරිදි සාරාංශගත කළ හැකි ය:**

1- ගමන හා බැඳුණු නීති.

2- හජ් අනිවාර්ය වනුයේ කවදා ද? එය අනිවාර්ය වගකීමක් වනුයේ කා හට ද?

3- හජ් හෝ උම්රා සඳහා ඉහ්රාම් තත්ත්වයට පැමිණිය යුත්තේ කොතැන සිට ද?

4- හජ් ඉටු කිරීමට නියම වූ වන්දනා ක්‍රම හා එහි වඩාත් උතුම් දෑ

5- තමත්තුඃ ක්‍රමයට හජ් ඉටු කිරීමේ ආකාරය, උම්රා සඳහා ඉහ්රාම් ආරම්භ කිරීමේ සිට හජ් නිමා කරන තෙක් වූ ක්‍රමවේදය කෙටියෙන්.

6- 'තවාෆුල් විදා' හෙවත් සමුගැනීමේ තවාෆය.

7- ඉහ්රාම් තත්ත්වයේ දී තහනම් කරන ලද දෑ.

8- තහනම් කරන ලද එම කරුණු සිදු කරන්නාගේ නීතිය.

9- 'මස්ජිදුන් නබවි' හෙවත් නබිතුමාණන්ගේ මස්ජිදය බැහැ දැකීම.

## ගමන හා බැඳුණු නීති

හජ් වන්දනාව සඳහා ගමන් කළ යුතු අතර, එය ම ගමනක් වන බැවින්, ගමන පිළිබඳ නීති මෙහි සාකච්ඡා කිරීම වැදගත් වන්නේය. ගමන හා බැඳුණු ඇතැම් නීති රීති ඇත. ඒවායින් වඩාත් ම වැදගත් වන්නේ සලාතය හා බැඳුණු කරුණු ය. ඒ ගැන පහත පරිදි සාරාංශ කළ හැකි ය:

**(අ)- පිරිසිදුකම:**

ගමනක නිරත වන මගියා වුළූ ගැනීමට, ස්නානය කිරීමට ජලය ලබන්නේ නම් ඔහු ඉන් පිරිසිදු විය යුතු ය. එය නොලැබුවේ නම් පිරිසිදු පසින් තයම්මුම් කර ගත යුතු ය. එහි දී ඔහු තම මුහුණ හා තම දෑත් ඉන් පිසදමා ගනියි. පොළොවට එක් වරක් අතින් ගසා පසු ව ඔහුගේ සම්පූර්ණ මුහුණ හා ඔහුගේ අත් දෙක එහි ඇඟිලිවල සිට ඔහුගේ වැළමිට දක්වා පෙදෙස, -එනම් ඔහුගේ අතේ සිට බාහු සන්ධිය- පිස දමයි.

එමගින් ඔහු පූර්ණ පිරිසිදුකම ලබයි. එම තයම්මුම් ක්‍රියාවලිය අවලංගු කරන දෙයකින් හෝ ජලය ලැබීමෙන් හෝ මිස අන් දෙයකින් එය අවලංගු නොවේ. ලුහර් සලාතය සඳහා ඔහු තයම්මුම් කර ගත් විටෙක ඔහුගේ පිරිසිදුභාවය අසර් දක්වා පවත්වා ගනී. නැවත තයම්මුම් නොකර ම අසර් සලාතය ඉටු කරයි.

එමෙන් ම මග්රිබ් හා ඉෂා දක්වා එම පිරිසිදුභාවය පවත්වා ගත්තේ නම් තයම්මුම් සිදු නොකර ම ඒ දෙක ඉටු කරයි.

මගියාට ස්නානය අනිවාර්යය වූ තත්ත්වයක් හට ගත් විටෙක, ඔහුට ජලය නොලැබුණේ නම්, තයම්මුම් සිදු කර ගනියි. එය ඔහුගේ ස්නානය අනිවාර්ය වූ තත්ත්වය පහ කරයි. ජලය ලැබුණු විටෙක ජනාබත් තත්ත්වය නැවත මතු වන අතර එවිට ස්නානය කර ගැනීම ඔහුට අනිවාර්ය වේ. මල මූත්‍ර කිරීමෙන් කිලිටි වූ විටෙක පිරිසිදු කිරීමට ජලය නොලැබුණේ නම් තයම්මුම් සිදු කර ගනියි. එවිට ඔහුගේ කිලිටි තත්ත්වය පහ වෙයි. ජලය ලැබුණු විටෙක කිලිටි තත්ත්වය නැවත මතු වන අතර එවිට වුළූ සිදු කර ගැනීම ඔහුට අනිවාර්ය වේ. එය නබිතුමාණන්ගේ ප්‍රකාශය පදනම් කර ගනිමිනි.

﴿الصَّعِيدُ الطَّيِّبُ وَضُوءُ المُسْلِمِ وَإِنْ لَمْ يَجِدِ المَاءَ عَشْرَ سِنِينَ فَإِذَا وَجَدَ المَاءَ فَلْيَتَّقِ اللَّهَ وَلْيُمِسَّهُ بَشَرَتَهُ﴾

"වසර දහයකට ජලය නොලැබුණ ද, පිරිසිදු පස මුස්ලිම්වරයෙකුගේ වුළූ ධෝවනය(ට විකල්පයක්) වේ. එහෙත් ජලය ලැබුණු විටක ඔහු අල්ලාහ්ට බැතිමත් විය යුතු යි. ඔහු තම ශරීරය එයින් (ජලයෙන්) තෙමා ගත යුතු යි."

තවත් හදීසයක:

﴿طَهُورُ الْمُسْلِمِ﴾

"මුස්ලිම්වරයකුගේ පිරිසිදුකම" යනුවෙන් සඳහන් වී ඇත. මෙය ඉමාම් අහ්මද් විසින් වාර්තා කර ඇති අතර ඉමාම් තිර්මිදි හසන් ගණයට අයත් සහීහ් හදීසයක් බව ප්‍රකාශ කර ඇත.[1]

මගියා ඔහුගේ මේස් සපත්තු මත රාත්‍රි ඇතුළු ව දින තුනක් පිරිමදියි. එහෙත් පදිංචිකරු රාත්‍රිය ඇතුළු ව එක් දිනක් පමණක් පිරිමදියි.

**(ආ) අනිවාර්ය සලාතය ඉටු කිරීම.**

මගියා ළුහර්, අසර් හා ඉෂා යන සිව් රක්ආත් සහිත සලාතයන් රක්ආත් දෙකක් ලෙස කෙටි කරමින් ඉටු කරයි. එය ඔහු තම ප්‍රදේශයෙන් පිටත් ව ගිය අවස්ථාවේ සිට නැවත එහි පැමිණෙන දක්වා වූ කාලය තුළ ය. ඔහුගේ ගමන දිගු වුව ද කෙටි වුව ද එලෙස ම

[1] මෙය අබූ දාවුද්තුමා 'කිතාබුත් තහාරා' හි අනිවාර්ය ස්නානය වූ අවස්ථාවක තයම්මුම් කිරීම යන මාතෘකාව යටතේ වාර්තා කර ඇත. හදීස් අංක 332. ඉමාම් තිර්මිදිතුමා 'කිතාබුත් තහාරා' හි අනිවාර්ය අවස්ථාවක තයම්මුම් කිරීමේ දී පිළිපැදිය යුතු කරුණු යන මාතෘකාව යටතේ වාර්තා කර ඇත. හදීස් අංක 124. ඉමාම් අන්-නසාර්තුමා 'කිතාබුත් තහාරා'හි එක් තයම්මුම් වාරයකින් සලාත් කිහිපයක් ඉටු කිරීම යන මාතෘකාව යටතේ වාර්තා කර ඇත. හදීස් අංක (323), ඉමාම් අහ්මද්තුමා අබූ දර්තුමා විසින් දැනුම් දී ඇති වාර්තාව (5/146) යටතේ ප්‍රකාශ කර ඇත. පළමු ව සඳහන් කර ඇති ප්‍රකාශය බස්සාර්තුමා සතු වදන් පෙළ යි. (9/387) හදීස් අංක (3973)

ය. සහීහුල් බුහාරිහි අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා ප්‍රකාශ කළ හදීසයක් මෙසේ ය.

﴿خَرَجْنَا مَعَ النَّبِيِّ ﷺ من المدينة إِلَى مَكَّةَ (يعنى: فى حجة الوداع) فَكَانَ يُصَلِّي رَكْعَتَيْنِ رَكْعَتَيْنِ حَتَّى رَجَعْنَا إِلَى الْمَدِينَةِ. قُلْتُ: أَقَمْتُمْ بِمَكَّةَ شَيْئًا قال: أَقَمْنَا بِهَا عَشْرًا﴾

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමග මදීනාවේ සිට මක්කාව වෙත අපි පිටත් ව ගියෙමු. (එය හජ්ජතුල් වදා අවස්ථාවෙහි ය.) එතුමාණන් නැවත මදීනාවට හැරී එන තෙක් ම සලාතය රක්ආත් දෙක බැගින් එහි ඉටු කරන්නට වූහ. 'ඔබලා මක්කාවේ දින කීයක් නවාතැන් ගත්තෙහු ද?' යැයි මම එතුමාගෙන් විමසා සිටියෙමි. එතුමා: 'අපි එහි දින දහයක් නවාතැන් ගෙන සිටියෙමු' යැයි පැවසුවේය.[1]

මේ පිළිබඳ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: "අල්ලාහ් සලාතය අනිවාර්යය කළ අවස්ථාවේ, පදිංචිකරුවෙකු ව සිටිය ද ගමනක නිරත ව සිටිය ද රක්ආත් දෙක දෙක බැගින්

---

[1] ඉමාම් බුහාරි 'සලාතය කෙටි කිරීම' යන මාතෘකාවෙහි සලාතය කෙටි කිරීමේ දී සඳහන් කරුණු යන පාඩමේ හදීස් අංක (1081) යටතේ මෙය වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම්තුමා මගීන්ගේ සලාතය හා එය කෙටි කිරීම යන පාඩමේ හදීස් අංක (693) යටතේ මෙය වාර්තා කර ඇත.

එය අනිවාර්යය කළේය. ගමනක දී ඉටු කරන සලාතයේ රක්ආත් ගණන පිළිගනු ලැබූ අතර පදිංචිකරුවෙකු ව සිටිය දී ඉටු කරන සලාතයේ වැඩි කරන ලදී."[1]

ඔහු සතු වෙනත් වාර්තාවක: "සලාතය වාර දෙක බැගින් අනිවාර්ය කරන ලදී. පසු ව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ හිජ්රත් කළහ. එවිට එය වාර හතරක් ලෙස අනිවාර්ය කරන ලද අතර මගියාගේ සලාතය මුල් අයුරින් ම පැවතෙන්නට අත්හැර දමන ලදී."[2]

ඉමාම් මුස්ලිම් සතු තවත් වාර්තාවක: "මගී සලාතය පළමු ව අනිවාර්ය වූ අයුරින් ම පිළිගනු ලැබීය."[3]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ එතුමාණන්ගේ ගමනේ එක වතාවක් හෝ සලාතය මුළුමනින් ම ඉටු කළ බවට සඳහන් වී නැත. මගියා විසින් රක්ආත් හතරේ සලාතයන් රක්ආත් දෙක

---

[1] ඉමාම් බුහාරි මෙය 'සලාත්' යන පාඩමේ 'ඉස්රා නම් නිශා ගමනේ සලාතය අනිවාර්ය වූයේ කෙසේ ද' යන මාතෘකාව යටතේ හදීස් අංක 350 හරහා මෙය වාර්තා කර ඇත. සහ ඉමාම් මුස්ලිම් විසින්, සංචාරකයින්ගේ යාච්ඤාව සහ එය කෙටි කිරීමේ පොතේ අංක (685).

[2] ඉමාම් බුහාරිතුමා 'අල්-මනාකිබ්' යන පාඩමේ 'දින නියම කළේ කොතැන් පටන් ද?' යන මාතෘකාව යටතේ මෙය වාර්තා කර ඇත. (3935)

[3] ඉමාම් මුස්ලිම්තුමා මෙය 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ අංක (2/685) යටතේ වාර්තා කර ඇත.

දක්වා කෙටි කිරීම අනිවාර්යය බව බහුතර විද්වතුන් පෙන්වා දී ඇත්තේ එබැවිනි. සහීහුල් බුහාරිහි අබ්දුර් රහ්මාන් ඉබ්නු යසීද්තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේ සඳහන් වේ. ඔහු මෙසේ පැවසීය: උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා මිනාවෙහි දී රක්ආත් හතර බැගින් අපට සලාතය මෙහෙය වූහ. එවිට එය අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු තුමාණන් හට පවසන ලදී. නැවත හැරී බලන්නට ගත්තේය. පසු ව මෙසේ පැවසීය: මම අල්ලාහ්ගේ දූතයාණන් සමග මිනාවෙහි රක්ආත් දෙක බැගින් සලාතය ඉටු කර ඇත්තෙමි. අබූ බක්ර් (රළියල්ලාහු අන්හු) තුමා සමගත් මිනාවෙහි රක්ආත් දෙක බැගින් සලාතය ඉටු කර ඇත්තෙමි. උමර් ඉබ්නු අල්-කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා සමගත් මිනාවෙහි රක්ආත් දෙක බැගින් ඉටු කර ඇත්තෙමි. රක්ආත් හතර වෙනුවට පිළිගනු ලැබූ රක්ආත් දෙකෙහි කොටස්කරුවකු වීම ගැන මා සතුටු විය යුතු නොවේ ද!"[1]

[1] ඉමාම් බුහාරි තුමා 'අත්-තක්සීර්' (කෙටි කිරීම) යන පාඩමේ 'අස්-සලාතු බි මිනා' (මිනාවෙහි සලාත් ඉටු කිරීම) යන මාතෘකාව යටතේ අංක 1084 දරන හදීසය තුළින් වාර්තා කර ඇත. එමෙන්ම ඉමාම් මුස්ලිම්තුමා 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ මිනාවෙහි සලාතය කෙටි කිරීම යන මාතෘකාව යටතේ අංක 695 දරන අංකයෙන් වාර්තා කර ඇත.

උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා (රක්ආත් හතරක් ලෙස) සලාතය සම්පූර්ණ ව ඉටු කිරීම සුහවාදී නොවන කරුණක් බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා පෙන්වා දුන්නේ ඒ ගැන නැවත ආවර්ජනය කර බලන මෙන් සිහි ගන්වමිනි. සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ හා එතුමාණන්ගේ මිතුරන් දෙදෙනාගේ පිළිවෙත ඊට වෙනස් අයුරින් පිහිටා තිබුණු බව හෙතෙම පැහැදිලි කළේය.

උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා තම කිලාෆත් ධූර කාලයේ මිනාවෙහි වසර හයක් හෝ අටක් පමණ කාලයක් සලාතය කෙටි කරමින් ඉටු කළහ. පසුව සහීහ් මුස්ලිම්හි සඳහන් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමාගේ හදීසය පරිදි එය සම්පූර්ණයෙන් ඉටු කර ඇත. එතුමා මෙසේ පැවසීය: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මිනාවෙහි මගියකුගේ සලාතය ඉටු කළ අතර අබූ බක්ර්, උමර් සහ උස්මාන් (රළියල්ලාහු අන්හුම්) යන උතුමන්ලා වසර අටක කාලයක් හෝ වසර හයක කාලයක් ඒ අයුරින් සලාතය ඉටු කර ඇත්තාහ.[1] එතුමා දුටු දේ ගැන අර්ථ

[1] ඉමාම් මුස්ලිම් 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ 'කස්රුස් සලාත් බි මිනා' (මිනාවෙහි සලාතය කෙටි කිරීම) යන මාතෘකාව යටතේ අංක (18/694) දරන හදීසයෙන් වාර්තා කර ඇත.

නිරූපණය එසේ සම්පූර්ණ වූ අතර, එම අර්ථ නිරූපණය සම්බන්ධයෙන් විද්වතුන්ගේ වාර්තා සහ ප්‍රකාශ විවිධ විය.

මගියා ඉමාම් වරයා පසුපසින් සිට සලාතය ඉටු කළ විට, ඔහු එය සම්පූර්ණ කරයි. එසේ සම්පූර්ණ කිරීම ඔහුට අනිවාර්ය වේ. මූසා ඉබ්නු සල්මා අල්-හද්ලීතුමා විසින් වාර්තා කළ හදීසයක් (සහීහ් මුස්ලිම්) හි මෙසේ ප්‍රකාශ වී ඇත: මම ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමාගෙන් "මම මක්කාවේ සිටින විට, ඉමාම් සමග සලාත් ඉටු නොකළෙම් නම්, මා සලාතය ඉටු කළ යුත්තේ කෙසේ ද? යැයි විමසා සිටියෙමි. එවිට හෙතෙම: "අබුල් කාසිම් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ පිළිවෙතට අනුව රක්ආත් දෙක බැගිනි." යැයි පවසා සිටියේ ය.[1]

ඒ සම්බන්ධ ව තවදුරටත් නාෆිඃතුමා විසින් මෙසේ සඳහන් කරන ලදී: "ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා ඉමාම් සමග සලාතය ඉටු කළේ නම්, රක්ආත්

[1] ඉමාම් මුස්ලිම් 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ 'සලාතුල් මුසාෆිරීන වකස්රුහා' (මගීන්ගේ සලාතය හා එය කෙටි කිරීම) යන මාතෘකාව යටතේ අංක (688) දරන හදීසයෙන් වාර්තා කර ඇත.

හතරක් සලාත් ඉටු කර ඇති අතර, තනි ව එය ඉටු කළේ නම් රක්ආත් දෙක බැගින් සලාතය ඉටු කර ඇත." [1]

ඉමාම් සමග සලාතයේ ආරම්භයේ හෝ එහි අතරවාරයේ හෝ ඔහු පිවිසුණ ද එලෙස ම ය. එය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ පොදු ප්‍රකාශයට අනුව ය.

﴿فَمَا أَدْرَكْتُمْ فَصَلُّوا وَمَا فَاتَكُمْ فَأَتِمُّوا﴾

"ඔබට කුමක් ලැබුවේ ද එය ඉටු කරනු. ඔබට කුමක් මග හැරුණේ ද එය පූර්ණවත් කරනු."[2]

මගියා ළුහර් හා අසර් අතර හෝ මග්රිබ් හා ඉෂා අතර ඒකාබද්ධ කිරීම වනාහි, ඔහු ගමනේ යෙදෙමින් සිටිය දී එය සුන්නාවක් වේ. එනම් මගියකු ලෙස සිටින තත්ත්වයේ ය. සහීහ් අල් බුහාරිහි ඉබ්නු අබ්බාස්

---

[1] ඉමාම් මුස්ලිම් 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ 'කස්රුස් සලාත් බි මිනා' (මිනාවෙහි සලාතය කෙටි කිරීම) යන මාතෘකාව යටතේ අංක (17/694) දරන හදීසයෙන් වාර්තා කර ඇත.

[2] ඉමාම් බුහාරි 'අල් අදාන්' (සලාතය සඳහා ඇරයුම) යන පාඩමේ 'ලා යස්ආ ඉලස් සලාති' (සලාතය සඳහා දිව නොයා යුතු ය) යන මාතෘකාව යටතේ අංක (636) දරන හදීසයෙන් වාර්තා කර ඇත. එමෙන් ම 'ෆාතනස් සලාත" (සලාතය අපෙන් අතපසු විය) යන මාතෘකාව යටතේ ද සඳහන් කර ඇත. එමෙන් ම ඉමාම් මුස්ලිම් 'අල් මසාජිද්' (දේවස්ථාන) යන පාඩමේ 'ඉස්තිහ්බාබු ඉත්යානුස් සලාත් බිවකාරින් වසකීනතින්' (සලාතය සඳහා නිහතමානී ව සන්සුන් ව පැමිණීම සතුටුදායක ය) යන මාතෘකාව යටතේ අංක (602) (603) දරන හදීස් හරහා වාර්තා කර ඇත.

(රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කළ හදීසයක මේ ගැන මෙසේ සඳහන් වී ඇත:

﴿كَانَ رَسُولُ اللَّهِ ﷺ يَجْمَعُ بَيْنَ صَلَاةِ الظُّهْرِ وَالْعَصْرِ إِذَا كَانَ عَلَى ظَهْرِ سَيْرٍ وَيَجْمَعُ بَيْنَ الْمَغْرِبِ وَالْعِشَاءِ﴾

"අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ගමනක නිරත ව සිටිය දී ළුහර් හා අසර් සලාතය අතර එතුමාණෝ ඒකාබද්ධ කළ අතර මග්රිබ් හා ඉෂා සලාත් අතර ද ඒකාබද්ධ කළහ."[1]

එක් තැනකට ගොඩ බැස්සේ නම් සුන්නාව වනුයේ සලාතය ඒකාබද්ධ නොකිරීම ය. මක් නිසා ද යත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මිනාවෙහි එසේ ඒකාබද්ධ නොකළහ. ඊට හේතුව එතුමාණන් එහි ගොඩ වැදී ඇති බැවිනි. ඔහු සලාතය ඒකාබද්ධ කළ ද එහි වරදක් නැත. විශේෂයෙන් ම තම වගකීම් ඉටු කිරීමෙහි නිරත වීම හා එහි විවේකය සඳහා නින්දට වැටීම යනාදි අවශ්‍යතාවක් වී නම් එසේ සිදු කළ හැකි ය. බුහාරි හා මුස්ලිම්හි අබූ ජුහයිෆා (රළියල්ලාහු අන්හු) විසින් වාර්තා කළ හදීසයක් මෙසේ සඳහන් ව ඇත.

---

[1] ඉමාම් බුහාරි 'අත්-තක්සීර්' (සලාතය කෙටි කිරීම) යන පාඩමේ 'අල්-ජම්උ ෆිස්-සෆරි බයිනල් මග්රිබි වල් ඉෂාඉ' (ගමනක දී මග්රිබ් හා ඉෂා සලාත් අතර ඒකාබද්ධ කිරීම) යන මාතෘකාව යටතේ අංක (1107) දරන හදීසයෙන් වාර්තා කර ඇත. මෙය මුඅල්ලක් ගණයට අයත් හදීසයකි.

﴿أَنَّ النَّبِيَّ ﷺ خَرَجَ مِنْ قُبَّةٍ كَانَتْ لَهُ بِالأَبْطَحِ بِمَكَّةَ قَالَ أَبُو جُحَيْفَةَ: خَرَجَ بِالْهَاجِرَةِ -يَعْنِي: شِدَّةَ الحَرِّ- إِلَى البَطْحَاءِ فَتَوَضَّأَ ثُمَّ صَلَّى الظُّهْرَ رَكْعَتَيْنِ وَالعَصْرَ رَكْعَتَيْنِ﴾

සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මක්කාවේ විවේක ගැනීම සඳහා තනන ලද කූඩාරමකින් බැහැරට පැමිණ අල් බත්හා වෙත ගියහ. අබූ ජුහෙයිෆාතුමා මෙසේ පැවසීය: එතුමාණන් එසේ බැහැර වූයේ මධ්‍යහ්න වේලාවක ය. එනම් දැඩි හිරු රශ්මිය ඇති අවස්ථාවක ය. පසු ව එතුමා වුළූ ධෝවනය කර, ළුහර් රක්අාත් දෙකක් ද අසර් රක්අාත් දෙකක් ද ඉටු කළහ.[1]

සහීහ් මුස්ලිම්හි සඊද් ඉබ්නු ජුබෙයිර්තුමා ඉබ්නු අබ්බාස්තුමාගෙන් ලබා වාර්තා කළ හදීසයක් මෙසේ සඳහන් වේ.

﴿جَمَعَ رَسُولُ اللَّهِ ﷺ فى سفرة سافرها فِي غَزْوَةِ تَبُوكَ فَجمع بَيْنَ الظُّهْرِ وَالْعَصْرِ وَالْمَغْرِبِ وَالْعِشَاءِ قَالَ سعيد: فقُلْتُ لابن عباس: مَا أَرَادَ بِذَلِكَ قَالَ: أَرَادَ أَلَّا يُحْرِجَ أُمَّتَهُ﴾

---

[1] ඉමාම් බුහාරිතුමා "කිතාබුල් මනාකිබ්" යන පාඩමේ "සිෆතුන් නබී" (නබිතුමාණන්ගේ ගුණාංග) යන මාතෘකාවේ හදීස් අංක (3553) යටතේ වාර්තා කර ඇත. එමෙන් ම මුස්ලිම්තුමා "කිතාබුස් සලාත්" යන පාඩමේ "සුත්රතුල් මුසල්ලී" (සලාත් ඉටු කරන්නා ආවරණයක් භාවිත කිරීම) යන මාතෘකාවේ හදීස් අංක (503) යටතේ වාර්තා කර ඇත.

තබූක් සංග්‍රාමයේ දී අල්ලාහ්ගේ දූතයාණෝ ගමනක නිරත ව සිටිය දී සලාතය ඒකාබද්ධ කළහ. එසේ ළුහ්ර් හා අසර්, මග්රිබ් හා ඉෂා ඒකාබද්ධ කර ඉටු කළහ. සර්ද්තුමා මෙසේ පැවසීය: මින් අදහස් කරන්නේ කුමක් දැ යි මම ඉබ්නු අබ්බාස්තුමාගෙන් විමසා සිටියෙමි. එතුමා: 'තම සමූහයා අපහසුතාවයට පත් නොවීම එතුමාණන් ඉන් අදහස් කළ බව පැවසුවේය.[1] මුආද් බින් ජබල් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ මේ හා සමාන හදීසයක් පූර්ණ ලෙස සඳහන් ව ඇත.[2]

"තම සමූහයා අපහසුතාවයට පත්වීම" යන්නෙන් අදහස් කරනුයේ දුෂ්කරතා හා පීඩාවන්ට මුහුණ දීමට සිදු වීම යන්න යි.

**(ඇ) අතිරේක සලාතය:**

පදිංචිකරුවා අතිරේක සලාත් ඉටු කරන්නාක් මෙන් මගියා ද අතිරේක සලාතයන් ඉටු කිරීම ආගමානුකූල

---

[1] ඉමාම් මුස්ලිම් 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ 'අල්-ජම්උ බයිනස් සලාතයිනි ෆිල් හළ්ර්' (පදිංචි ව සිටිය දී සලාත් දෙකක් ඒකාබද්ධ කර ඉටු කිරීම) යන මාතෘකාවේ (51/705) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත.

[2] ඉමාම් මුස්ලිම් 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ 'අල්-ජම්උ බයිනස් සලාතයිනි ෆිල් හළ්ර්' (පදිංචි ව සිටිය දී සලාත් දෙකක් ඒකාබද්ධ කර ඉටු කිරීම) යන මාතෘකාවේ (706) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත.

කරන ලද්දකි. ඒ අනුව ඔහු තහජ්ජුද්, විත්ර්, ළුහා, තහියියතුල් මස්ජිද් වැනි සලාත් හා කුසූෆ් සලාත් ඉටු කරයි. අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලද හදීසයක් සහීහ් අල් බුහාරිහි මෙසේ සඳහන් වේ.

﴿رَأَيْتُ النَّبِيَّ ﷺ إِذَا أَعْجَلَهُ السَّيْرُ يُؤَخِّرُ الْمَغْرِبَ فَيُصَلِّيهَا ثَلَاثًا ثُمَّ يُسَلِّمُ ثُمَّ قَلَّمَا يَلْبَثُ حَتَّى يُقِيمَ الْعِشَاءَ فَيُصَلِّيهَا رَكْعَتَيْنِ ثُمَّ يُسَلِّمُ وَلَا يُسَبِّحُ بَعْدَ الْعِشَاءِ حَتَّى يَقُومَ مِنْ جَوْفِ اللَّيْلِ﴾

"නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්හට හදිසි ගමනක් යෑමට සිදු වූ විටෙක මග්රිබ් සලාතය ප්‍රමාද කොට රක්ආත් තුනක් ලෙස එය ඉටු කර, සලාම් දෙයි. පසු ව ඉෂා සලාතය ඉටු කරන තෙක් රැඳී සිට, එය රක්ආත් දෙකක් ලෙස ඉටු කර, සලාම් දෙයි. ඉෂා සලාතයෙන් පසු මධ්‍යම රාත්‍රියේ අවදි වන තෙක් කිසිදු සලාතයක් ඉටු කරන්නේ නැත."[1]

[1] ඉමාම් බුහාරි 'කිතාබුත් තක්සීර්' (සලාතය කෙටි කිරීම) යන පාඩමේ 'හල් යුඅද්දිනු අව් යුකීමු ඉදා ජමඅ බයිනල් මග්රිබි වල් ඉෂාඉ' (මග්රිබ් හා ඉෂා අතර ඒකාබද්ධ කරන විට අදාන් හා ඉකාමත් පැවසිය යුතු ද?) යන මාතෘකාවේ (1109) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම් 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ 'ජවාසුල් ජම්ඉ බයිනස් සලාතයිනි ෆිස් සෆරි' (ගමනේ දී සලාත් දෙක අතර ඒකාබද්ධ කිරීමේ අවසරය) යන මාතෘකාවේ (703) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත.

සඊද් ඉබ්නු යසාර්තුමා වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ: මම අබ්දුල්ලාහ් ඉබ්නු උමර් සමග මක්කාවේ වීදියක ගමන් කරමින් සිටියෙමු. සඊද්තුමා මෙසේ පවසා සිටියේය: සුබ්හු ලඟා වනු ඇතැ යි මා බියට පත් වූ කල්හි, මම (ප්‍රවාහනික සත්වයාගෙන්) බැස විත්ර් ඉටු කර පසු ව එතුමා සමග සේන්දු වූයෙමි. එවිට අබ්දුල්ලාහ් ඉබ්නු උමර් තුමා: ඔබ සිටියේ කොහේ ද? යැයි විමසුහ. මම: 'මම සුබ්හු ළඟා වනු ඇතැ යි බිය වී, බැස විත්ර් ඉටු කළෙමි' යැයි පැවසුවෙමි. එවිට අබ්දුල්ලාහ් මෙසේ පැවසීය: අල්ලාහ්ගේ දූතයාණන් කෙරෙන් ඔබට යහපත් ආදර්ශයක් නොවී ද? එවිට මම: 'එසේ ය, අල්ලාහ් මත දිවුරමින්'. ඔහු මෙසේ පැවසීය: "සැබැවින් ම අල්ලාහ්ගේ දූතයාණෝ කොටළුවා මත හිඳ විත්ර් ඉටු කරන්නෙක් වූහ".[1]

අබ්දුර් රහ්මාන් ඉබ්නු අබී ලය්ලා විසින් වාර්තා කළ තවත් හදීසයක් මෙසේ සඳහන් වේ. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එහා සලාතය ඉටු කර

---

[1] ඉමාම් බුහාරි 'කිතාබුල් විත්ර්' (විත්ර් සලාතය) යන පාඩමේ 'අල් විත්රු අලද් දාබ්බති' (සත්වයා මත හිඳ විත්ර් ඉටු කිරීම) යන මාතෘකාවේ (999) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම් 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන පාඩමේ 'ජවාදු සලාතින් නාෆිලා අලද් දාබ්බති ෆිස් සෆරි' (ගමනේ දී සත්වයා මත හිඳ සුන්නත් සලාත් ඉටු කිරීමේ අවසරය) යන මාතෘකාවේ (36/700) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත.

ඇති බව උම්මු හානීතුමිය හැර වෙනත් කිසිවෙකු මට දන්වා සිටියේ නැත. සැබැවින් ම එතුමිය: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා 'ෆත්හු මක්කා' දින තම නිවසට පිවිස රක්ආත් අටක් ඉටු කළ බව පවසා සිටියාය.[1]

සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ කතාදා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් තවදුරටත් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ:

﴿إِذَا دَخَلَ أَحَدُكُمُ الْمَسْجِدَ فَلَا يَجْلِسْ حَتَّى يُصَلِّيَ رَكْعَتَيْنِ﴾

"ඔබ අතුරින් කිසිවෙක් හෝ මස්ජිදය ට පිවිසියේ නම් රක්ආත් දෙකක් සලාතයට ඉටු කරන තෙක් වාඩි නොවන්න."[2]

---

[1] ඉමාම් බුහාරි 'කිතාබුත් තක්සීර්' (සලාතය කෙටි කිරීම) යන පාඩමේ 'මන් තතව්වඅ ෆිස් සෆරි ෆී ගයිරි දුබුරිස් සලවාත්' (ගමනේ දී අනිවාර්ය සලාතයන් නොවන අතිරේක සලාත් ඉටු කරන්නා) යන මාතෘකාවේ (1103) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම් 'සලාතුල් මුසාෆිරීන්' (මඟීන්ගේ සලාතය) යන පාඩමේ 'ඉස්තිහ්බාබු සලාතිල් ළුහා' (ළුහා සලාතය සතුටුදායක ය) යන මාතෘකාවේ (80/336) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත.

[2] ඉමාම් බුහාරි 'කිතාබුත් තහජ්ජුද්' (තහජ්ජුද් සලාතය) යන පාඩමේ 'මා ජාඅ ෆිත් තතව්වුඉ මස්නා මස්නා' (දෙවාරයක් බැගින් අතිරේක සලාත් ඉටු කිරීම සම්බන්ධයෙන් සඳහන් දෑ) යන මාතෘකාවේ (1163) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම් 'කිතාබුස් සලාත්' (සලාතය) යන පාඩමේ 'ඉස්තිහ්බාබු තහිය්යතිල් මස්ජිද්' (තහිය්යතුල් මස්ජිද් ඉටු කිරීම

සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පවසා සිටි සූර්යග්‍රහණයක දී ඉටු කරන සලාතය හා බැඳුනු කතාවක ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලද හදීසයක් තව දුරටත් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ:

﴿إِنَّ الشَّمْسَ وَالْقَمَرَ آيَتَانِ مِنْ آيَاتِ اللهِ لَا يَخْسِفَانِ لِمَوْتِ أَحَدٍ وَلَا لِحَيَاتِهِ فَإِذَا رَأَيْتُمُوهما -يَعْنِي: مُنخَسِفَيْنِ- فَافْزَعُوا إِلَى الصَّلَاةِ﴾

"සැබැවින් ම හිරු හා සඳු අල්ලාහ්ගේ සංඥා අතුරින් වූ සංඥා දෙකකි. කිසිවකුගේ මරණය සඳහා හෝ කිසිවකුගේ උපත සඳහා හෝ චන්ද්‍රග්‍රහණ සිදු වන්නේ නැත. ඔබ ඒ (ග්‍රහණ) දෙක දුටු විට, සලාත් ඉටු කිරීම සඳහා යුහුසුලු වනු."[1]

මෙම හදීස් දෙක පොදු හදීස් දෙකකි. මේ දෙකෙහි නියමිත වේලාව හැර වෙනත් වේලාවක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නියම

---

සතුටුදායක ය) යන මාතෘකාවේ (714) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත.

[1] ඉමාම් බුහාරි 'කිතාබුල් කුසූෆ්' (ග්‍රහණ සලාතය) යන පාඩමේ 'කුත්බතුල් ඉමාම් ෆිල් කුසූෆ්' (ග්‍රහණ සලාතයේ ඉමාම්වරයාගේ දෙසුම) යන මාතෘකාවේ (1046) දරන අංකය යටතේ මෙය වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම් 'කිතාබුල් කුසූෆ්' (සූර්ය චන්ද්‍ර ග්‍රහණ) යන පාඩමේ 'සලාතුල් කුසූෆ්' (ග්‍රහණ සලාතය) යන මාතෘකාවේ (901) දරන හදීස් අංකය යටතේ මෙය වාර්තා කර ඇත.

නොකළ අතර ගමනක හැර පදිංචි ව සිටිය දී පමණක් එය ඉටු කළ යුතු යැයි නියම කළේ ද නැත.

ජාබිර් ඉබ්නු අබ්දිල්ලාහ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ බව සහීහ් අල් බුහාරිහි මෙසේ සඳහන් වෙයි:

﴿ كَانَ النَّبِيُّ ﷺ يُصَلِّي التَّطَوُّعَ وَهُوَ رَاكِبٌ فِي غَيْرِ الْقِبْلَةِ ﴾

"නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ප්‍රවාහනය කරන මගියෙකු ව සිටිය දී කිබ්ලා නොවන දිසාවට හැරී අතිරේක සලාත් ඉටු කරන්නෙක් වූහ."[1]

අත්-තතව්වුඃ යන පදයේ 'ال' යන නිපාතය වර්ගය අදහස් කරයි. එමෙන් ම සමස්තය යන අදහස ද එය උසුලයි. දෙවැනි අදහස ද මින් සහතික වේ. එනම්, සැබැවින් ම, අතිරේක සලාතයන් අත්හැර දමන මෙන් යම් සාධකයක් පැමිණෙන තෙක් ඒවා ආගමානුකූල වූ ආකාරයට ම පැවතීම මූලධර්මය යි. එහර් මග්රිබ් හා ඉෂා සලාතයේ අතිරේක සලාතයන් සම්බන්ධ ව හැර අනෙක් අතිරේක සලාතයන් අතහැර දමන මෙන් සාධක පැමිණ නැත.

---

[1] ඉමාම් බුහාරිතුමා 'කිතාබුත් තක්සීර්' (සලාතය කෙටි කිරීම) යන මාතෘකාවේ 'සලාතුත් තතව්වුඉ අලද් දවාබ්බි' (වාහනය මත හිඳ අතිරේක සලාතය ඉටු කිරීම) යන පාඩමේ හදීස් අංක (1094) යටතේ මෙය වාර්තා කර ඇත.

හෆ්ස් ඉබ්නු ආසිම් ඉබ්නු උමර් ඉබ්නු අල්-කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ බවට හදීසයක් සහීහ් මුස්ලිම්හි මෙසේ සඳහන් වෙයි: මම ඉබ්නු උමර් තුමා සමග මක්කා මාර්ගයේ ගමනක සහභාගී වූයෙමි යි (වාර්තාකරු) මෙසේ පැවසීය: "ඉබ්නු උමර්තුමා අපට ළුහර් සලාතය රක්ආත් දෙකක් ලෙස ඉටු කරවීය. පසු ව හෙතෙම ඉදිරියට ගිය අතර අපි ද ඔහු සමඟ ඔහුගේ තවලමට ළඟා වන තෙක් ගියෙමු. එතුමා වාඩි වූ අතර අපි ද එතුමා සමඟ වාඩි වූයෙමු. එතුමා සලාත් ඉටු කරන දෙසට බැල්ම හෙළූ විට, ඔහු සිටගෙන සලාත් ඉටු කරන අය දැක: 'ඔවුන් සිදු කරන්නේ කුමක් ද?' යැයි විමසුවේය. මම: 'ඔවුහු අල්ලාහ් ව සුවිශුද්ධ කරමින් සුන්නාහ් සලාත් ඉටු කරමින් සිටිති ' යැයි පැවසුවෙමි. එවිට ඉබ්නු උමර්තුමා මෙසේ පැවසුවේය: 'අහෝ මාගේ සහෝදරයාගේ පුතණුව, මම එසේ කරන්නෙකු ලෙස සිටියෙමි නම්, මා මගේ සලාතය සම්පූර්ණ ව ඉටු කරන්නට තිබුණි.' යැයි පැවසුවේය. මම අල්ලාහ්ගේ දූතයාණන් සමඟ ගමන් කර ඇත්තෙමි. අල්ලාහ් එතුමාණන් ව අත්පත්කර ගන්නා තුරු (මරණයට පත්වන තුරු) එතුමාණන් රක්අත් දෙකකට අමතර ව කිසිවක් ඉටු කළේ නැත. මම අබූ බකර්තුමා සමඟ ද ගමන් කර ඇති අතර අල්ලාහ් එතුමා ව අත්පත් කර ගන්නා තුරු එතුමා ද රක්අත් දෙකකට අමතර ව කිසිවක් ඉටු කළේ නැත.

මම උමර්තුමා සමඟ ද ගමන් කර ඇති අතර අල්ලාහ් එතුමා ව අත්පත් කර ගන්නා තුරු එතුමා රක්අත් දෙකකට අමතර ව කිසිවක් ඉටු කළේ නැත. මම උස්මාන්තුමා සමඟ ද ගමන් කර ඇති අතර, අල්ලාහ් එතුමාව අත්පත්කර ගන්නා තුරු එතුමා රක්අත් දෙකකට අමතර ව කිසිවක් ඉටු කළේ ද නැත." තව ද අල්ලාහ් මෙසේ පවසා ඇත: "අල්ලාහ්ගේ දූතයා කෙරෙන් ඔබට යහපත් ආදර්ශයක් ඇත"[1] (සූරා අල් අහ්සාබ් 33 :21)

මග්රිබ් හා ඉෂා සලාත් අතර ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් පෙර සඳහන් කරන ලද හදීසයෙන් පෙනී යන්නේ සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඒ දෙකට අදාළ සුන්නත් සලාතයන් ඉටු කර නැති වග යි.[2]

"මම එසේ කරන්නෙකු ලෙස සිටියෙම් නම්, මා මගේ සලාතය සම්පූර්ණ ව ඉටු කරන්නට තිබුණි." යන ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමාගේ ප්‍රකාශයේ

[1] ඉමාම් මුස්ලිම්තුමා 'කිතාබු සලාතිල් මුසාෆිරීන්' (මගියන්ගේ සලාතය) යන මාතෘකාවේ 'සලාතුල් මුසාෆිරීන වකස්රිහා' (මගියන්ගේ සලාතය හා එය කෙටි කිරීම) යන පාඩමේ හදීස් අංක (689) යටතේ මෙය වාර්තා කර ඇත. එමෙන් ම ඉමාම් බුහාරි 'කිතාබුත් තක්සීර්' (සලාතය කෙටි කිරීම) යන මාතෘකාවේ 'මන් ලම් යතතව්වඃ ෆිස් සෆරි දුබර අස් සලාති' (අනිවාර්ය සලාතයෙන් පසු ගමනක දී සුන්නත් සලාත් ඉටු නොකරන්නන්' යන පාඩමේ හදීස් අංක (1101-1102) යටතේ මෙය වාර්තා කර ඇත.

[2] ඒ ගැන පෙර සඳහන් කර ඇත. (පිටුව: 07)

අදහස වනාහි: එසේ මම අතිරේක සලාත් ඉටු කරන්නෙක් වීමි නම් මාගේ අනිවාර්ය සලාතය කෙටි කිරීමකින් තොර ව මට සම්පූර්ණ කරන්නට තිබුණි. එය සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තම වාහනය මත අතිරේක සලාත් ඉටු කළ බවත් ඒ මත වී විත්ර් සලාතය ඉටු කළ බවත් එතුමා විසින් සහතික කර ඇති සාධකය අනුව ය. සැබැවින් ම එතුමාණන් එසේ සිදු කළ බව දන්වා ඇත.

ඉමාම් බුහාරිතුමා තම සහීහ් ග්‍රන්ථයේ: 'ගමනක දී කෙරෙන සලාතයෙන් පසු හා ඒවාට පෙර අතිරේක සලාත් ඉටු නොකරන්නන්' යන පාඩමේ හා 'ගමනක දී සලාතයෙන් පෙර හා පසු ඇති අතිරේක සලාතයත් නොවන වෙනත් අතිරේක සලාත් ඉටු කරන්නන්' යන පාඩමේ' විග්‍රහ කර ඇත.

ෆජ්ර් සලාතයට අදාළ අතිරේක සලාතය වනාහි, එය පදිංචි ව සිටිය ද ගමනක සිටිය ද ඉටු කරනු ලැබේ. මන්ද, ෆජ්ර් සලාතයට අදාළ රක්ආත් දෙක පිළිබඳ දැක්වූ දැඩි සැලකිල්ල වෙනත් අතිරේක සලාත් සඳහා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා දක්වා නැති බැවිනි. එතුමාණෝ ඒ දෙක කිසිවිටෙක අත්හැර නැත. එමෙන් ම ඒ පිළිබඳ ව ආඉෂා (රළියල්ලාහු අන්හා)

තුමිය විසින් වාර්තා කළ හදීසයක් සහීහ් අල් බුහාරි (ෆත්හුල් බාරි) 3/42 යටතේ සඳහන් වී ඇත. (23)[1]

සහීහ් මුස්ලිම්හි අබූ කතාදා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේ සඳහන් වේ.

﴿أَنَّهُ كَانَ مَعَ النَّبِيِّ ﷺ فَذَكَرَ قِصَّةَ نَوْمِهِمْ عَنْ صَلَاةِ الفَجْرِ حَتَّى طَلَعَتِ الشَّمْسُ وَأَنَّ النَّبِيَّ ﷺ أَمَرَهُمْ فَسَارُوا عَنْ مَكَانِهِمْ ثُمَّ نَزَلَ فَتَوَضَّأَ ثُمَّ أَذَّنَ بِلاَلٌ بِالصَّلَاةِ فَصَلَّى رَسُولُ اللهِ ﷺ رَكْعَتَيْنِ ثُمَّ صَلَّى الغَدَاةَ فَصَنَعَ كَمَا يَصْنَعُ كُلَّ يَوْمٍ﴾

එතුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමග සිටියේය. ඔවුන්ගේ නින්ද ඔවුන් ව හිරු උදාවන තෙක් ම ෆජ්ර් සලාතයෙන් දුරස් කළ කතාව මෙනෙහි කළේය. සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඔවුනට ඒ ගැන නියෝග කළහ. ඔවුන් සිටි ස්ථානයෙන් ඔවුන් ගමන් කර, පසු ව බැස වුළූ ධෝවනය කර ගත් අතර පසු ව බිලාල්තුමා සලාතය සඳහා අදාන් පවසා ඇරයුම්

---

[1] ඉමාම් බුහාරිතුමා 'කිතාබුත් තහජ්ජුද්' (තහජ්ජුද් සලාතය) යන මාතෘකාවේ 'තආහුදු රකඅතයිල් ෆජ්රි' (ෆජ්ර් සලාතයට අදාළ අතිරේක රකආත් දෙක කෙරෙහි දැක්වූ සැලකිල්ල) යන පාඩමේ හදීස් අංක (1169) යටතේ මෙය වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම්තුමා 'සලාතුල් මුසාෆිරීන්' (මගීන්ගේ සලාතය) යන මාතෘකාවේ 'ඉස්තිහ්බාබු රකඅතයි සුන්නතිල්' ෆජ්රි (ෆජ්ර් සලාතයට අදාළ අතිරේක රකආත් දෙක ඉටු කිරීම සතුටුදායක ය) යන පාඩමේ හදීස් අංක (94/724) යටතේ මෙය වාර්තා කර ඇත.

කළේය. අල්ලාහ්ගේ දූතයාණෝ රක්අත් දෙකක් ඉටු කර පසු ව ෆජ්ර් සලාතය ඉටු කළහ. එතුමාණෝ සෑම දිනක ම ක්‍රියා කළ ආකාරයෙන් ම ක්‍රියා කළහ.[1]

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ මෙවැනි ම හදීසයක් එතුමා සතු ව ඇත.[2]

මගියා අතිරේක සලාත් ඉටු කිරීම සම්බන්ධයෙන් අප දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමට හේතුව වනාහි: පොදුවේ මගියා අතිරේක සලාත් ඉටු නොකළ යුතු යැයි ඇතැමුන් අදහස් කරන බැවිනි. අපි සඳහන් කළ කරුණු වලින් පැහැදිලි වන්නේ: ළුහර්, මග්රිබ් හා ඉෂා සලාතයන්ට අදාළ අතිරේක සලාත් ඉටු කිරීමේ අවශ්‍යතාවක් නැති අතර ඒ හැර අනෙකුත් අතිරේක සලාත් ඉටු කිරීමේ අවසරය ඇති බව ය. එය ආගමානුකූල කරනු ලැබූවක් ලෙස පවතී. උත්තරීතර අල්ලාහ් ආශීර්වාද කරන සේක්වා!

මගියා තම වාහනය මත වී කිබ්ලා දිශාවට නොහැරුණ ද, වෙනත් කවර දිශාවකට හැරී සිටිය ද අතිරේක සලාතය ඉටු කිරීමේ අවසරය ඔහුට ඇත.

---

[1] ඉමාම් මුස්ලිම් 'කිතාබුල් මසාජිද්' (දේවස්ථාන) යන මාතෘකාව යටතේ 'කළාඋස් සලාතිල් ෆාඉතා' (මග හැරුණු සලාතය නැවත ඉටු කිරීම) යන පාඩමේ අංක 681 දරන හදිසයේ සඳහන් කර ඇත.

[2] ඉමාම් මුස්ලිම් 'කිතාබුල් මසාජිද්' (දේවස්ථාන) යන මාතෘකාව යටතේ 'කළාඋස් සලාතිල් ෆාඉතා' (මග හැරුණු සලාතය නැවත ඉටු කිරීම) යන පාඩමේ අංක 680 දරන හදිසයේ සඳහන් කර ඇත.

සහීහ් අල් බුහාරි හි ජාබිර් ඉබ්නු අබ්දිල්ලා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේ සඳහන් වේ:

﴿أَنَّ النَّبِيَّ ﷺ كَانَ يُصَلِّي عَلَى رَاحِلَتِهِ نَحْوَ الْمَشْرِقِ فَإِذَا أَرَادَ أَنْ يُصَلِّيَ الْمَكْتُوبَةَ -يعني: الفريضة- نَزَلَ فَاسْتَقْبَلَ الْقِبْلَةَ﴾

සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නැගෙනහිර දිශාවට මුහුණ ලා තම වාහනය මත වී සලාත් ඉටු කර ඇත. එමෙන් ම අනිවාර්යය කරන ලද සලාතයක් ඉටු කිරීමට අපේක්ෂා කළේ නම්, ඉන් බැස කිබ්ලා දිසාවට හැරී සලාත් ඉටු කර ඇත.[1]

ගමනේ දී පිළිපැදිය යුතු තවත් නීතියක් වනුයේ: සහය සඳහා මගියා සමග තවත් සහයකයකු එකතු කර ගැනීම ය. යම් නිශ්චිත අවශ්‍යතාවක් හෝ අල්ලාහ්ගේ මාර්ගයේ අරගල කිරීම වැනි ආගමික කටයුත්තක දී හැර මිනිසෙකු තනි ව ගමන් නොකළ යුතු ය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැවසූ බව, අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් අල්-බුහාරිහි මෙසේ සඳහන් වේ.

---

[1] මෙය ඉමාම් බුහාරිතුමා 'කිතාබුත් තක්සීර්' (සලාතය කෙටි කිරීම) යන පාඩමේ 'බාබු යන්සිලු ලිල්මක්තූබති' (අනිවාර්ය සලාතය සඳහා වාහනයෙන් බිමට බැසීම) යන මාතෘකාවේ අංක 1099 දරන හදීසයේ වාර්තා කර ඇත.

﴿لَوْ يَعْلَمُ النَّاسُ مَا فِي الْوَحْدَةِ مَا أَعْلَمُ مَا سَارَ رَاكِبٌ بِلَيْلٍ وَحْدَهُ﴾

"තනි ව ගමන් කිරීම ගැන මා දන්නා දෑ මිනිස්සු දැන ගත්හ නම්, රාත්‍රියේ කිසිදු මගියෙකු තනි ව ගමන් නොකරනු ඇත."[1]

ඔහුට යම් ව්‍යසනයක් හෝ වෙනත් යම් විපත්තියක් හෝ සිදු වූයේ නම්, ඔහු ව හඳුනාගත හැකි අයුරින් නම, ලිපිනය සහතික කරන ලද යමක් ඔහු සමග තබා ගත යුතු ය.

ගමනේ දී පිළිපැදිය යුතු තවත් නීතියක් වනුයේ: මහ්රම් අයකුගෙන් තොර ව කාන්තාවක ගමනක නිරත නොවීම ය. එම ගමන දුර බැහැර ගමනක් හෝ සුළු දුර ප්‍රමාණයක් වුව ද, එසේ නැතහොත් හජ් වන්දනාව වෙනුවෙන් හෝ ඒ හැර වෙනත් දෙයක් වෙනුවෙන් වුව ද, ඇය ලස්සන තරුණියක හෝ මැහැල්ලියක වුව ද, ඇය සමග සිටින අය ඇගේ ඥාතී හා හිතමිතුරු කාන්තාවන් වුව ද එසේ නොවුව ද, ඇයට එය යහපත් යැයි සිතුව ද එසේ නැති වුව ද, ගුවන් යානයක හෝ වෙනත් වාහනයක වුව ද ඒ සියල්ල එක සමාන ය. ඇයට අනුමත වන්නේ නැත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ

[1] ඉමාම් බුහාරි 'කිතාබුල් ජිහාද්' පාඩමේ 'බාබ් අස්සියරි වහ්දහ්' (තනි ව ගමන් කිරීම) යන මාතෘකාවේ හදීස් අංක 2998 යටතේ මෙය ප්‍රකාශ කර ඇත.

දේශනයකට තමන් සවන් දුන් බව පවසමින් ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කළ හදීසයක් සහීහ් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ:

﴿لَا يَخْلُوَنَّ رَجُلٌ بِامْرَأَةٍ إِلَّا وَمَعَهَا ذُو مَحْرَمٍ وَلَا تُسَافِرِ الْمَرْأَةُ إِلَّا مَعَ ذِى مَحْرَمٍ فَقَامَ رَجُلٌ فَقَالَ: يَا رَسُولَ اللهِ إِنَّ امْرَأَتِي خَرَجَتْ حَاجَّةً وَإِنِّي اكْتُتِبْتُ فِي غَزْوَةِ كَذَا وَكَذَا قَالَ ﷺ: انْطَلِقْ فَحُجَّ مَعَ امْرَأَتِكَ﴾

'මහ්රම් අයෙකු නොමැති ව සිටින කාන්තාවක සමඟ පිරිමියෙකු තනි ව නොසිටිය යුතුය. කාන්තාව සිය මහ්රම් කෙනෙකු සමග මිස ගමන් බිමන්වල නිරත නොවිය යුතු ය. එවිට පුද්ගලයෙකු නැගිට: "අල්ලාහ්ගේ දූතයාණෙනි, මාගේ භාර්යාව හජ් ඉටු කිරීම සඳහා තනි ව පිටත් ව ගොස් ඇත. මම අසවල් අසවල් සටන්වලට නම් දුන් අයෙක් වෙමි." යැයි පැවසීය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ: "ඔබ ගොස්, ඔබේ බිරිඳ සමඟ හජ් ඉටු කරන්න." යැයි පැවසූහ.[1]

---

[1] ඉමාම් බුහාරිතුමා ජිහාද් නම් පාඩමේ 'මන් ඉක්තතබ ෆී ජෛයිසින් ෆකඃරජත් ඉම්රඅතුහු හාජතන්' (යුද්ධයක් සඳහා නම් දුන් අයකු වී, ඔහුගේ බිරිය යම් අවශ්‍යතාවක් සඳහා පිටත් ව යාම) යන මාතෘකාවේ හදීස් අංක 3006 යටතේ මෙය වාර්තා කර ඇති අතර, ඉමාම් මුස්ලිම් හජ් පාඩමේ 'බාබු සෆරිල් මර්අති මඅ මහ්රම්' (කාන්තාව මහ්රම් අයකු සමග ගමන් කිරීම) යන මාතෘකාවේ හදීස් අංක 1341 තුළින් මෙය වාර්තා කර ඇත.

මහ්රම් අයකුගෙන් තොරව කාන්තාවක ගමනක නිරත වීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තහනම් කළහ. එතුමාණෝ එය එක් සංචාරයකට වඩා තවත් එකකට හෝ, එක් කාන්තාවකට වඩා තවත් කාන්තාවකට හෝ, එක් තත්ත්වයකට වඩා තවත් තත්ත්වයකට හෝ සීමා නොකළ අතර ඔහු පුරුෂයාගෙන් ඔහුගේ බිරිඳ ගැන විමසුවේ ද නැත.

අල් මහ්රම් යනුː සැමියා, ලේ ඥාතීත්වය හේතුවෙන් හෝ කිරි පෙවීම හේතුවෙන් හෝ විවාහය (තුළින් ඇතිවන ඥාතිත්වය) හේතුවෙන් හෝ කාන්තාවක් සමග විවාහ වීමට තහනම් උදවිය.

සමීප ඥාතිත්වය හෝ කිරි පෙවීම හේතුවෙන් මහ්රම් වන උදවිය සත් දෙනෙකිː පියා, (පියාගේ පියා වැනි) ඔහුගෙන් ඉහළට, පුතා (පුතාගේ පුතා වැනි) ඔහුගෙන් පහළට, සහෝදරයා, ඔහුගේ පුතා හා (සහෝදරයාගේ පුතාගේ පුතා වැනි) ඉන් පහළට, සහෝදරියගේ පුතා හා (සහෝදරියගේ පුතාගේ පුතා වැනි) ඔහුගෙන් පහළට, මාමා සහ (ලොකු මාමා වැනි) ඔහුගෙන් ඉහළට, පිය සහෝදර බාප්පා හෝ (මහප්පා වැනි) ඉන් ඉහළට.

විවාහය හේතුවෙන් කාන්තාවකට මහ්රම් වන උදවිය සිව් දෙනෙකිː සැමියාගේ පියා හා (ඔහුගේ පියා

වැනි) ඔහුගෙන් ඉහළට, සැමියාගේ වෙනත් භාර්යාවකට දාව උපන් පුතා හා (ඔහුගේ පුතා වැනි) ඔහුගෙන් පහළට, දුවගේ සැමියා හා ඔහුගෙන් පහළට, මවගේ වෙනත් කසාදයක සැමියා හා ඔහුගෙන් ඉහළට, එහෙත් මෙසේ මහ්රම් වනුයේ විවාහක ස්වාමිපුරුෂයා ඔහුගේ භාර්යාව සමඟ ලිංගික සම්බන්ධතා ඇති කර ගත් විටෙක ය.

එමෙන් ම මහ්රම් තැනැත්තා වැඩිවියට පත් සිහිබුද්ධිය ඇත්තෙකු විය යුතු ය. ළමුන් හා සිහිබුද්ධිය නැති උදවිය සමග ගමනක නිරත වීම වලංගුභාවයට ප්‍රමාණවත් වන්නේ නැත.

මේ අනුව කාන්තාවකට මහ්රම් අයකු නොලැබුණේ නම් හජ් ඉටු කිරීම ඇයට අනිවාර්ය වන්නේ නැත. මක් නිසා ද යත් ඒ සඳහා වන පහසුකම් ඇය ලබන්නට හැකියාවක් නොමැති බැවිනි.

## හජ් අනිවාර්ය වූයේ කවදා ද?

ඉස්ලාමීය විද්වතුන්ගේ වඩාත් ප්‍රචලිත ප්‍රකාශ වනුයේ හිජ්රි වර්ෂ නවයේ හෝ දහයේ හජ් අනිවාර්ය වූ බව ය. හජ් වගකීම අනිවාර්ය කරමින් උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය එම කාලයට අනුගත ව පහළ වී තිබීම පෙර කී මතය තහවුරු කරයි:

﴿...وَلِلَّهِ عَلَى ٱلنَّاسِ حِجُّ ٱلۡبَيۡتِ مَنِ ٱسۡتَطَاعَ إِلَيۡهِ سَبِيلٗاۚ وَمَن كَفَرَ فَإِنَّ ٱللَّهَ غَنِيٌّ عَنِ ٱلۡعَٰلَمِينَ ٩٧﴾ [آل عمران:97]

"... තව ද හජ් සඳහා පහසුකම් ඇත්තවුනට එම ගෘහයෙහි අල්ලාහ් වෙනුවෙන් හජ් වන්දනාමාන කිරීම ජනයා හට පැවරුණු වගකීමකි. තව ද කවරෙක් ප්‍රතික්ෂේප කළේ ද (ඔහු අලාභවන්තයෙකි.) සැබැවින් ම අල්ලාහ් ලෝවැසියන්ගෙන් කිසිදු අවශ්‍යතාවයක් අනවශ්‍ය ධනවතා ය." (ආලු ඉම්රාන්: 97)

මෙම පාඨය සූරා ආලු ඉම්රාන්හි මැද කොටසෙහි සඳහන් ව ඇති අතර එය හිජ්රි නවවන වසරේ 'ආමුල් වුෆූද්' නම් අධික ලෙස කණ්ඩායම් වශයෙන් ඉස්ලාමය වැළඳගැනීමට මදීනාවට පැමිණි වර්ෂයේ දී පහළ කරන ලද්දකි.

එය අනිවාර්ය වීම ප්‍රමාද වීමේ ප්‍රඥාව මැනවින් දන්නේ අල්ලාහ් ය. සැබැවින් ම මක්කාව මෙම

වර්ෂයට පෙර කුරෙයිෂ් අතර සිටි බහුදේවවාදීන්ගේ පාලනය තුළ පැවැතුණි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට හෝ එතුමාණන්ගේ හිතමිතුරන්ට හෝ පූර්ණ අයුරින් හජ් ඉටු කිරීමේ අවස්ථාව ඇහිරී තිබුණි. හුදෙයිබිය්යා ගිවිසුම අවස්ථාවේ කළ උම්රා වන්දනාවට ද දිගු කාලයක් ගත වී තිබුණි. හිජ්රතයට පසු වසර හයකට බහුදේවවාදීන් විසින් අල්ලාහ්ගේ දූතයාණන් හා ඔහුගේ හිත මිතුරන් හට උම්රා පරිපූර්ණ කිරීමට බාධක පනවා තිබුණි.

හජ් වන්දනාව මූල්‍යමය හා ශාරීරික පහසුකම් ඇති, සිහි බුද්ධිය ඇති, වැඩිහිටි සෑම මුස්ලිම්වරයකුට ම අනිවාර්ය වේ.

වැඩිහිටි නොවන අයට හජ් අනිවාර්ය වන්නේ නැත. එහෙත් ඔහුගේ හජ් වන්දනාව වලංගු වේ. අතිරේක හජ් වන්දනාවක් ඉටු කළ මහිමය එහි දී ඔහුට හිමිවනු ඇත. ඔහු වැඩිවියට පත් වූ විටෙක අනිවාර්ය හජ් වන්දනාව ඉටු කළ යුතු ය. මක් නිසා ද යත් වැඩිහිටි අවදියට ළඟා වීමට පෙර කළ හජ් වන්දනාව ඔහුට නියම කරන ලද කාලයට පෙර ඉටු කළ හජ් වන්දනාවක් වන නිසා ය. එය කෙනෙක් අනිවාර්ය සලාතය නියමිත කාලයට පෙර ඉටු කළ විටෙක පවතින අවස්ථාව හා සමාන ය.

තම මුදලින් හජ් වන්දනාව ඉටු කිරීමට අපොහොසත් දිළින්දන් හා වහලුන් වැනි අයට හජ් වන්දනාව අනිවාර්ය වන්නේ නැත. එය උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය පදනම් කර ගනිමිනි.

﴿...مَنِ ٱسْتَطَاعَ إِلَيْهِ سَبِيلًا ....﴾ [آل عمران:97]

"හජ් සඳහා පහසුකම් ඇත්තවුනට (පැවරුණු වගකීමකි.)" (ආලු ඉම්රාන්: 97)

ඒ අනුව, මොහුට ඒ සඳහා පහසුකම් නැති බැවින් හජ් වන්දනාව ඔහුට අනිවාර්යය වන්නේ නැත.

ශාරීරික ව හජ් වන්දනාව ඉටු කිරීමට අපොහොසත් වූ අය වනාහි, මහලුකම හෝ රෝගීකම හේතුවෙන් ඔහු එය ඉටු කිරීමට අපොහොසත් වුයේ නම්, ඔහු වෙනුවෙන් හජ් ඉටු කරන නියෝජිතයෙකුට එය පැවරිය යුතු ය. නියෝජිතයා ද හදිසි රෝගී තත්ත්වයක පෙළෙන්නේ නම්, එය සුව වන තුරු බලාපොරොත්තුවෙන් හිඳ, පසු ව එය ඉටු කළ යුතු ය. ඊට පෙර ඔහු මිය ගියේ නම්, ඔහු වෙනුවෙන් ඔහුගෙන් පසු පැවත එන උදවිය විසින් ඉටු කළ යුතු ව ඇත.

මුස්ලිම්වරයකුට හජ් වන්දනාව අනිවාර්ය වනුයේ කවදා ද එවිට ඔහු එය ඉටු කිරීමට යුහුසුලු විය යුතු ය. මක් නිසා ද යත් අල්ලාහ්ගේ හා ඔහුගේ දූතයාණන්ගේ නියෝගය කාල නියමයකින් සීමා කර නොමැති නම් සහ ඒවා ලිහිල් කිරීම සඳහා වන බවට කිසිදු සාක්ෂියක්

නොමැති නම්, ඒවා ක්ෂණික ව විය යුතු නිසාවෙනි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළ බවට ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක ඒ ගැන මෙසේ සඳහන් වේ.

﴿تَعَجَّلُوا إِلَى الْحَجِّ - يَعْنِي الْفَرِيضَةَ - فَإِنَّ أَحَدَكُمْ لَا يَدْرِى مَا يَعْرِضُ لَهُ﴾

"හජ් සඳහා යුහුසුලු වන්න. -එනම්, අනිවාර්ය පළමු හජ් වන්දනාව යි- ඔබ අතුරින් කිසිවෙක් හෝ තමන්ට කුමක් සිදු වේ දැ යි නොදනී."[1] මෙය ඉමාම් අහ්මද් විසින් වාර්තා කර ඇති අතර මෙහි වාර්තා සම්බන්ධතාවේ දුර්වලකමක් ඇත. එහෙත් මෙම හදීසයෙන් තහවුරු වන ක්ෂණික ව සිදු කිරීම යන ප්‍රකාශයට පොදුවේ සාධක සඳහන් ව ඇත.

[1] ඉමාම් අහ්මද්ගේ මුස්නද් හි මෙය වාර්තා කර ඇත. (1/314)

## හජ් හෝ උම්රා සඳහා ඉහ්රාම් තත්ත්වයට පැමිණිය යුත්තේ කොතැන සිට ද?

හජ් හෝ උම්රා සඳහා අපේක්ෂා කරන්නන් අල්ලාහ්ගේ දූතයාණන් නියම කළ සීමා මාඉම්හි ඉහ්රාම් බැඳිය යුතු ය. ඒවා මාඉම් පහකි.

**පළමුවැන්න:** දුල් හුලෙයිෆා - එය 'අබ්යාරු අලී' යනුවෙන් ද හඳුන්වනු ලැබේ. එය මදීනා වාසීන් හා ඒ හරහා ගමන් කරන අනෙකුත් වාසීන් සඳහා වේ.

**දෙවැන්න:** අල්-ජුහ්ෆා - විනාශ වී ගිය පුරාණ ගම්මානයකි. එබැවින් මිනිස්සු එය වෙනුවට රාබිග් නැමැති ස්ථානය වර්තමානයේ භාවිත කරති. එය සිරියානු වැසියන් සඳහා ද ඒ හරහා ගමන් කරන අය ඊට පෙර පවතින දුල් හුලෙයිෆා හරහා ගමන් නොකළේ නම් එවැන්නන් සඳහා ද වේ.

**තුන්වැන්න:** යලම්ලම් එය තිහාමා හි පිහිටි කන්දක් හෝ ස්ථානයකි. එය සඃදියියා යන නමින් ද හැඳින් වේ. එය යමන් වාසීන් හා ඒ හරහා ගමන් කරන වෙනත් අය සඳහා නියම කරන ලද්දකි.

**සිව්වැන්න:** කර්නුල් මනාසිල් - එය අස්-සෙයිල් යන නමින් ද හැඳින්වේ. එය නජ්ද් වාසීන් හා ඒ හරහා ගමන් කරන වෙනත් අය සඳහා නියම කරන ලද්දකි.

**පස්වැන්න:** දාතු ඉරක් - එය 'අල්-ළරීබාහ්' යන නමින් ද හැඳින් වේ. එය ඉරාක් වාසීන් හා ඒ හරහා ගමන් කරන වෙනත් අය සඳහා නියම කරන ලද්දකි.

කවරෙකු මේ මාඉම් හරහා හජ් හෝ උම්රා අපේක්ෂාවෙන් ගමන් කරන්නේ ද එහි ඉහ්රාම් බැඳ චේතනා තැබීම ඔහුට අනිවාර්ය වේ.

ගුවන් මාර්ගයෙන් හෝ මුහුදු මාර්ගයෙන් ගමන් කිරීමේ දී ඒවාට සමාන්තර ව පිහිටන්නේ නම් එයට අනුගත වූ ස්ථානයේ ඉහ්රාමයට අදාළ චේතනා තැබීම ඔහුට අනිවාර්ය වේ.

﴿...وَمَن يَتَعَدَّ حُدُودَ ٱللَّهِ فَأُوْلَٰٓئِكَ هُمُ ٱلظَّٰلِمُونَ﴾ [البقرة:229]

"කවරෙකු අල්ලාහ්ගේ සීමාවන් ඉක්මවා යන්නේ ද ඔවුහු ම ය අපරාධකරුවෝ" (අල්-බකරා: 229)

කවරෙකු මෙම සීමා මාඉම් ඇතුළත මක්කාවට කිට්ටුවෙන් සිටින්නේ ද ඔහු අදාළ ස්ථානයේ සිට ම ඉහ්රාමයට අදාළ චේතනාව තබා ගනු ඇත. කවරෙකු මක්කාවේ සිටින්නේ ද මක්කාව සිට ම ඉහ්රාමයට අදාල චේතනාව තබා ගනු ඇත. එහෙත් උම්රා සඳහා ඔවුහු හරම් සීමාවෙන් පිටතට ගොස් ඉහ්රාම් ඇඳ ගනිති. එනම්: සැතපුම් ගණනකින් හරම් සීමාවට පිටතින් සිටිමිනි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අබ්දුර් රහ්මාන් ඉබ්නු අබී බක්ර්තුමාට මෙසේ පැවසූහ.

﴿اخْرُجْ بِأُخْتِكَ -يعنى: عائشة- من الْحَرَمِ فَلْتُهِلَّ بِعُمْرَةٍ﴾

ඔබේ සහෝදරිය සමග හරම් සීමාවෙන් පිටත් ව යන්න. ඇය උම්රා සඳහා චේතනා තැබිය යුතු ය.[1]

හජ් හෝ උම්රාවක් ඉටු කිරීමේ අපේක්ෂාවෙන් තොර ව කවරෙකු ව්‍යාපාරික කටයුත්තක් හෝ ඥාතීන් හමුවීම හෝ අධ්‍යාපන කටයුත්තක් වැනි කාර්යයක් අපේක්ෂාවෙන් මෙම සීමා මාඉම් හරහා ගමන් කරන්නේ ද ඉහ්රාම් පැලඳීම ඔහුට අනිවාර්ය වන්නේ නැත. මක් නිසා ද යත් සැබැවින් ම හජ් හා උම්රාව ජීවිත කාලය තුළ එක් වාරයකට වඩා වැඩියෙන් අනිවාර්ය නොවන බැවින් හා ඉහ්රාම් පැලඳිය යුත්තේ හජ් හෝ උම්රා සඳහා පමණක් වන බැවිනි.

---

[1] මෙය ඉමාම් බුහාරි කිතාබුල් හජ් නම් පාඩමේ 'අල් හජ්ජු අෂ්හුරුම් මඃලූමාත්' යන උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය' යන මාතෘකාවේ හදීස් අංක 1560 යටතේ වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම් කිතාබුල් හජ් නම් පාඩමේ 'බයානු වුජූහිල් ඉහ්රාම්' (ඉහ්රාම් පැළඳීමේ ක්‍රමය) යන මාතෘකාවේ හදීස් අංක (123/1211) යටතේ ආඉෂා රළියල්ලාහු අන්හා විසින් කරන ලද සඳහනක් වාර්තා කර ඇත.

## හජ් ඉටු කිරීමට නියම වූ වන්දනා චාරිත්‍ර හා ඒවායෙහි වඩාත් උතුම් දෑ

**වන්දනා චාරිත්‍ර තුනකි:** අත්-තමත්තුඃ, අල්-කිරාන් හා අල්-ඉෆ්රාද් ය.

**අත්-තමත්තුඃ යනු:** හජ් මාසවල උම්රා සඳහා අධිෂ්ඨාන කිරීම ය. එනම්: ෂව්වාල් මාසය පිවිසීමෙන් පසු ය. එය අවසන් කරගත් පසු ව එම වසරේ ම හජ් සඳහා අධිෂ්ඨාන කිරීම ය.

**අල්-කිරාන්:** හජ් හා උම්රා ඒකාබද්ධ කර ඒ දෙක ම එකට ඉටු කිරීමට අධිෂ්ඨාන කිරීම ය. එසේ නැතහොත් උම්රා සඳහා පමණක් අධිෂ්ඨාන කර පසු ව එහි තවාෆ් ඉටු කිරීමට පෙර හජ් වන්දනාව තුළට පිවිසීම ය.

**අල්-ඉෆ්රාද්:** හජ් සඳහා පමණක් අධිෂ්ඨාන කිරීම ය.

බහුතර විද්වතුන්ගේ මතය පුද්ගලයකුට මෙම ක්‍රම අතුරින් කවර හෝ ක්‍රමයක් පිළිපැදීමේ නිදහස ඇති බව ය. එහෙත් වඩාත් උතුම් වන්නේ කවර ක්‍රමයක් ද යන්න ගැන ඔවුහු විවිධ මත දරති. වඩාත් නිවැරදි මතය වනුයේ තමත්තුඃ ක්‍රමය වඩාත් උතුම් වන බව ය. මක් නිසා ද යත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඒ ගැන තම සහගාමීන්ට නියෝග කර ඇති අතර ඔවුන් ව දිරිගන්වා ඇති බැවිනි. එමෙන් ම බහුල ව පිළිපදිනු ලබන්නේ ද එම ක්‍රියාවලිය යි. එහි දී

සැබැවින් ම ඔහු උම්රාවෙහි ක්‍රියාවන් හා හජ්හි ක්‍රියාවන් සම්පූර්ණ ලෙස ඉටු කරනු ඇත. එමෙන් ම කල් ඇති ව මක්කාවට පැමිණෙන්නන් හට උම්රා හා හජ් අතර ඉහ්රාමයෙන් ඉවත් ව සිටීමට හැකි හේතුවෙන් අනෙක් චාරිත්‍රවලට වඩා එය ඔහුට වඩාත් පහසුවන බැවිනි.

තමත්තුඃ ක්‍රමයේ දී පුරප්පාඩු පිරවීම සඳහා නොව අල්ලාහ්ට ස්තුතිවන්ත වීම සඳහා සත්ත්ව කැපයක් ලබා දිය යුතු වේ. එය එක් එළුවෙකු හෝ සත් දෙනෙකු එකතු වී ඔටුවකු හෝ ගවයකු හෝ උල්හියියා ලබා දීමෙනි. අවුරුදු දින හෝ ඉන් පසු දින තුනක් තුළ ඔහු එම සත්වයා කපා හැර එය මිනා හෝ මක්කාවේ බෙදා හරියි. ඉන් කොටසක් ඔහු අනුභව කරයි. එහෙත් එම සත්ත්ව කැපය නොලැබුවේ නම් හජ් සමයේ දින තුනක් උපවාසයේ නිරත වෙයි. එය උත්සවයෙන් පසු දින තුනක් නොඉක්මවිය යුතු ය (එනම් අරෆා දිනට කලින් සිදු කළ යුතු වේ). එමෙන් ම නැවත නිවස වෙත පැමිණි විට දින හතක් උපවාසයේ නිරත විය යුතු ය.

සත්වයෙකු කැපීමේ හෝ ඒ වෙනුවට වෙනත් ආදේශකයක් අනිවාර්ය වීමේ විෂයෙහි කිරාන් ක්‍රමය ද තමත්තුඃ ක්‍රමය හා සමාන ය.

## තමත්තුඃ ක්‍රමයට හජ් ඉටු කිරීමේ ආකාරය, උම්රා සඳහා ඉහ්රාම් ආරම්භ කිරීමේ සිට හජ් නිමා කරන තෙක් වූ ක්‍රමවේදය කෙටියෙන්.

### (අ) උම්රා වන්දනාව

**1-** පුද්ගලයෙක් උම්රා සඳහා ඉහ්රාම් ඇද ගන්නට සිතූ විටෙක, ඔහු අනිවාර්ය ස්නානයක් ඉටු කරන්නාක් මෙන් ස්නානය කර ගනී. තමන්ට ලැබෙන වඩාත් සුවඳැති සුවඳ විලවුන් භාවිතා කර තම හිසට හා තම යටි රැවුලට තවරා ගනී. සුදුවන් උඩු සළුවක් හා යටි සළුවක් ඇද ගනී. කාන්තාව තම අලංකාරය ඉස්මතු නොවන අයුරින් ඇය කැමති ඇඳුමක් ඇද ගනු ඇත.

**2-** පසු ව අනිවාර්ය සලාතයක් සඳහා වූ වේලාවක නම්, එය පැලඳගත් පසු ගරු කිරීමක් වශයෙන් එම අනිවාර්ය සලාතය ඉටු කරයි. එය අනිවාර්ය සලාතයක් සඳහා වූ වේලාවක් නොවූයේ නම්, වුළු සඳහා වන සුන්නත් රක්ආත් දෙක ඉටු කරයි. එහෙත් එහි දී ඉහ්රාමයේ සුන්නා සලාතයක් ලෙස අධිෂ්ඨාන නොකළ යුතු ය. මක් නිසා ද යත් ඉහ්රාම් සඳහා සුන්නත් සලාතයක් ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් සහතික කර වාර්තාවක් සඳහන් වී නොමැති බැවිනි.

**3-** පසු ව සලාතය අවසන් කළ පසු උම්රා වන්දනාවේ පිවිසීමේ චේතනාව තබා ගනී. එහි දී ඔහු මෙසේ පවසයි:

﴿ لَبَّيْكَ اللَّهُمَّ لَبَّيْكَ لَبَّيْكَ لَا شَرِيكَ لَكَ لَبَّيْكَ إِنَّ الْحَمْدَ وَالنِّعْمَةَ لَكَ وَالْمُلْكَ لَا شَرِيكَ لَكَ، لَبَّيْكَ اللَّهُمَّ عُمْرَةً ﴾

“ලබ්බයික් අල්ලාහුම්ම ලබ්බයික්, ලබ්බයික් ලාෂරීක ලක ලබ්බයික්. ඉන්නල් හම්ද, වන්නිඃමත, ලක වල් මුල්ක් ලාෂරීක ලක්. ලබ්බයික් අල්ලාහුම්ම උම්රතන් ”

**තේරුම:** (යා අල්ලාහ්, (ඔබ ඉදිරියේ) පෙනී සිටින්නෙමි, ඔබේ ආරාධනය පිළිගෙන (ඔබ ඉදිරියේ) පෙනී සිටින්නෙමි, ඔබට සමාන වෙනත් කිසිවෙක් හෝ කිසිවක් හෝ නැත. සැබැවින් ම සියලු ප්‍රශංසා, ආශීර්වාද මෙන් ම බලය ද ඔබ සතු වන්නේය. ඔබට සමාන කිසිවෙක් නැත. අහෝ දෙවිඳුනි, මම උම්රා සඳහා පෙනී සිටිමි.)

තවාෆය ආරම්භ කරන තෙක් තල්බියා අධික වශයෙන් පැවසීම සුන්නාවකි. පසු ව එය අවසන් කර ගනී.

4- මක්කාවට ළඟා වූ විට ඔහු තවාෆුල් කුදූම් හෙවත් සම්ප්‍රාප්ත වීමේ තවාෆය ඉටු කරමින් කටයුතු ආරම්භ කරයි. එහි දී හජරුල් අස්වද් දෙසට යොමු වී එය තම දකුණතින් ස්පර්ෂ කරයි. සෙනඟ පිරී නොමැති

අවස්ථාවක පහසුකමක් ඇතොත් එය සිප ගනී. එසේ නැතහොත් ඒ වෙත සංඥා කරමින් තක්බීර් පවසයි.

පසු ව හැරී ගොස් ඔහුගේ වමත ගෘහය දෙසට පිහිටුවා ගනියි. පසු ව රුක්නුල් යමානී පසුකර ගිය විට - එය හජරුල් අස්වද් පිහිටි කොනෙන් පසු පිහිටා ඇති අවසන් කොන යි.- පහසුකමක් ඇත්නම් සිප ගැනීමෙන් තොර ව තම දකුණතින් එය ස්පර්ශ කරයි.

මෙසේ වට හතක් ගමන් කරයි. පිරිමියා පළමු වට තුනෙහි රම්ල් ගමනින් ගමන් කරන අතර සියලු ම තවාෆ් වාරයන්හි ඉල්තිබා ක්‍රමයට උඩු සළුව සකසා ගනී.

**රම්ල් යනු:** පාද ලඟින් ලඟ තබමින් ඉක්මනින් ගමන් කිරීම ය.

**ඉල්තිබාඃ යනු:** ඔහුගේ උඩු සළුවේ මැද කොටස දකුණු කිහිල්ලට යටින් තබා එහි කෙළවරවල් දෙක ඔහුගේ වම් උරහිස මත තැබීම ය.

ඔහු තවාෆ් අතරවාරයේ අල්ලාහ් ව මෙනෙහි කරයි, අල්ලාහ් ව සුවිශුද්ධ කරයි. තමන් කැමති ප්‍රාර්ථනාවන් නිහතමානී ව යටහත් පහත්බවින් යුතු ව හදවතින් ම ප්‍රාර්ථනා කරයි. හජරුල් අස්වද් ගල වෙත පැමිණෙන සෑම අවස්ථාවක ම තක්බීර් පවසයි. රුක්නුල් යමානී හා හජරුල් අස්වද් අතර මෙසේ පවසයි:

﴿ ...رَبَّنَآ ءَاتِنَا فِي ٱلدُّنۡيَا حَسَنَةٗ وَفِي ٱلۡأٓخِرَةِ حَسَنَةٗ وَقِنَا عَذَابَ ٱلنَّارِ ٢٠١ ﴾

[البقرة:201]

“රබ්බනා ආතිනා ෆිද්දුන්යා හසනතන් වෆිල් ආඛිරති හසනතන් වකිනා අදාබන්නාර්” (අල්-බකරා: 201)

**තේරුම:** (අපගේ පරමාධිපතියාණනි, මෙලොවෙහි යහපත ද පරලොවෙහි යහපත ද අපට පිරිනමනු මැනව! තව ද නිරයේ වේදනාවෙන් අප ආරක්ෂා කරනු මැනව!)

සෑම තවාෆ් වටයක් සඳහා ම ප්‍රාර්ථනාවක් නියම කිරීම දේව දූත සම්ප්‍රදා තුළින් මූලික වශයෙන් දක්නට නැත. එය අලුතින් ආරම්භ කරන ලද නවෝත්පාදන ක්‍රියාවලියකි.

5- තවාෆ් ඉටු කළ පසු මකාම් ඉබ්රාහීම් නම් ස්ථානය පසුපසට වී රක්ආත් දෙකක් ඉටු කළ යුතු වේ. ඉන් බැහැර ප්‍රදේශයක වුව ද ඉටු කළ හැක. ආරම්භ රකආතයේ සූරා අල්-ෆාතිහාවට පසු ව:

﴿قُلۡ يَٰٓأَيُّهَا ٱلۡكَٰفِرُونَ ١﴾ [الكافرون:1]

"කුල් යා අය්යුහල් කාෆිරූන්" සූරාව පවසයි. (අල්-කාෆිරූන්: 1)

දෙවන රකආතයේ:

﴿قُلۡ هُوَ ٱللَّهُ أَحَدٌ ١﴾ [الإخلاص:1].

"කුල් හුවල්ලාහු අහද්" සූරාව පවසයි. (අල්-ඉඛ්ලාස්: 1)

6- පසු ව සෆා හා මර්වා අතර හත් වාරයක් ගමන් කරයි. එහි දී සෆා කන්දෙන් ආරම්භ කර මර්වා කන්දෙන් අවසන් කරයි.

නබි පිළිවෙත වනුයේ: ඒ දෙකෙහි නැග, කිබ්ලා දෙසට මුහුණ ලා, තම දෑත් ඔසවා ගෙන අල්ලාහ් ව මෙනෙහි කිරීම හා ඔහුගෙන් ප්‍රාර්ථනා කර සිටීම ය.

එහි දී කොළ පැහැති සංඥා අතර වේගයෙන් වෙහෙස වී දිව යාම පිරිමියාට සුන්නාහ් වේ.

7- සඊ අවසන් කරගත් පසු තම හිසකෙස් කොට කර ගනී. එම කොට කිරීම සම්පූර්ණ හිස ම ආවරණය කළ යුතු වේ. කාන්තාව ඇඟිලි පුරුකක තරම් ප්‍රමාණයක් හිසකෙස් කොට කර ගනී.

එමගින් උම්රාව සම්පූර්ණ වනු ඇත. පසු ව ඔහු ඔහුගේ ඉහ්රාමයෙන් මිදෙයි. ඉහ්රාම් පැලඳ ගැනීමට පෙර අල්ලාහ් ඔහුට අනුමත කළ ඇඳුම්, සුවඳ විලවුන්, විවාහය හා අනෙකුත් දෑ භුක්ති විඳීම වලංගු වෙයි.

## (ආ) හජ් වන්දනාව

1- 'තර්වියයා' දිනය එනම් දුල් හිජ්ජා මස අට වැනි දිනය උදා වූ විට ඔහු කවර ස්ථානයක සිටින්නේ ද එම ස්ථානයේ සිට ම හජ් සඳහා ඉහ්රාම් පැලඳ ගනියි. උම්රාහි ඉහ්රාම් පැලඳගත් අවස්ථාවේ ස්නානය කිරීම, සුවඳ විලවුන් ගැල්වීම හා ඉහ්රාම් ඇඳුම් ඇඳීම යනාදි කටයුතු සිදු කළාක් මෙන් ම මෙහි දී ද ඉහ්රාම් පලඳින අවස්ථාවේ සිදු කරයි.

2- එය අවසන් කළ පසු හජ් වන්දනාවේ පිවිසීම සඳහා අධිෂ්ඨාන කරගෙන මෙසේ පවසයි:

﴿ لَبَّيْكَ اللَّهُمَّ لَبَّيْكَ لَبَّيْكَ لَا شَرِيكَ لَكَ لَبَّيْكَ إِنَّ الْحَمْدَ وَالنِّعْمَةَ لَكَ وَالْمُلْكَ لَا شَرِيكَ لَكَ، لَبَّيْكَ اللَّهُمَّ حَجًّا ﴾

"ලබ්බයික අල්ලාහුම්ම ලබ්බයික්, ලබ්බයික ලා ෂරීක ලක ලබ්බයික්, ඉන්නල් හම්ද වන්-නිඃමත ලක වල්-මුල්ක් ලා ෂරීක ලක්. ලබ්බෙයික අල්ලාහුම්ම හජ්ජන්"

**තේරුම**: (යා අල්ලාහ්, (ඔබ ඉදිරියේ) පෙනී සිටින්නෙමි, ඔබේ ආරාධනය පිළිගෙන (ඔබ ඉදිරියේ) පෙනී සිටින්නෙමි, ඔබට සමාන වෙනත් කිසිවෙක් හෝ කිසිවක් හෝ නැත. සැබැවින් ම සියලු ප්‍රශංසා, ආශීර්වාද මෙන් ම බලය ද ඔබ සතු වන්නේය. ඔබට සමාන කිසිවෙක් නැත. අහෝ දෙවිඳුනි, මම හජ්

සඳහා පෙනී සිටිමි.) මෙහි දී පිරිමින් උස් හඬින් මෙය පවසන අතර කාන්තාව එය පහත් හඬින් පවසනු ඇත.

අවුරුදු දින 'ජම්රතුල් අකබා' නම් ස්ථානයට ගල් විසි කරන තෙක් තල්බියා අධික වශයෙන් පැවසීම සුන්නාවකි. පසු ව එය අවසන් කර ගනී.

3- පසු ව මිනාවට පිටත් ව ගොස් එහි දී ළුහර්, අසර්, මග්රිබ්, ඉෂා සහ ෆජ්ර් සලාතයන් ඉටු කරයි. එහි දී රක්ආත් හතරක සලාතයන් රක්ආත් දෙකක් ලෙස කෙටි කර ඉටු කරනු ලබන අතර ඒවා ඒකාබද්ධ කර ඉටු නොකරනු ඇත.

4- නව වැනි දින හිරු උදා වූ විට අරෆා දෙසට ගමන් කරයි. පහසුකමක් ඇත්නම් දහවල් කාලයේ 'නමිරා' මස්ජිදයට ගොඩ වදියි. එසේ නැතිනම් අරෆාවට ගොඩ බසියි. මධ්‍යාහ්න කාලයේ හිරු අවරට යෑමට ආරම්භ වූ විටෙක ළුහර් හා අසර් සලාත් දෙක කෙටි කරමින් හා ඒකාබද්ධ කරමින් ඉටු කරයි. පසු ව අල්ලාහ් ව මෙනෙහි කිරීමට හා ඔහුගෙන් ප්‍රාර්ථනා කිරීමට කාලය වෙන්කර ගනියි. එහි දී කන්ද ඔහු පසුපසින් පිහිටා තිබුණ ද - ඔහු කිබ්ලාව මුහුණ ලා සිටියි. එසේ ඔහු හිරු අවරට යන තෙක්ම ක්‍රියා කරයි.

5- හිරු අවරට ගිය පසු, මුස්දලිෆා වෙතට ගමන් කරයි. එහි මග්රිබ් සලාතය රක්ආත් තුනක් ලෙස හා ඊෂා සලාතය රක්ආත් දෙකක් ලෙස ඉටු කරයි. ෆජ්ර්

සලාතය ඉටු කළ පසු අහස වඩාත් පැහැදිලි වන තෙක් අල්ලාහ් ව මෙනෙහි කිරීමෙහි හා ප්‍රාර්ථනා කිරීමෙහි නිරත වෙයි.

6- පසු ව අහස හොඳින් කහපැහැ ගැන් වූ පසු ව මිනා දෙසට ගමන් කරයි. එහි ළඟා වූ පසු මක්කා දෙසට වඩාත් සමීපයෙන් පිහිටා ඇති 'ජම්රතුල් අකබාවට" ගල් විසි කිරීමට ආරම්භ කරයි. එහි දී ගල් කැට හතක් එකින් පසු එක විසි කරයි. සෑම ගල් කැටයක් ම කඩල ඇටයක තරම් විය යුතු අතර සෑම ගල් කැටයක් ම විසි කරන විට යටහත් පහත්බවින් හා උත්තරීතර අල්ලාහ්ට ගරුබුහුමන් කරමින් තක්බීර් පැවසිය යුතු වේ.

ගල් කැට විසි කිරීමෙන් පසු, පහසුකමක් ඇත්නම් සත්ත්ව කැපය සිදු කරයි. පසුව ඔහුගේ මුළු හිස ම මුඩු කර ගනී. එසේ නැතහොත් හිසකෙස් කොට කර ගනී. මෙහි දී හිස මුඩු කිරීම වඩාත් උතුම් වේ. එහෙත් කාන්තාව නම්, ඇගේ හිසකෙස්වලින් ඇඟිලි පුරුකක තරම් කොටසක් ඇය කපා හරියි.

ගල් විසි කිරීම හා හිස මුඩු කිරීම හෝ කොට කිරීම තුළින් ඉහ්රාමයෙන් මිදීමේ පළමු අවස්ථාවෙන් ඔහු මිදෙයි. අනතුරු ව ඔහු සාමාන්‍ය ඇඳුමෙන් සැරසෙයි. සුවඳ විලවුන් ගල්වා ගනී. ඉහ්රාමයට පෙර ඔහුට අල්ලාහ් අනුමත කළ සියලු දෑ සිදු කරයි. එහෙත් බිරිය

සමග සංසර්ගයේ නිරත වීමේ කාර්යය හැර. ඉහ්රාමයෙන් මිදීමේ දෙවන අවස්ථාව දක්වා ඇය සමග ලිංගික ව බැඳීම ඔහුට අනුමත වන්නේ නැත.

පසු ව මක්කාවට ගොඩ වදියි. එහි හජ් වන්දනාවට අදාළ තවාෆය ඉටු කරයි. උම්රාහි තවාෆ් හා සඊ පිළිබඳ පෙර සඳහන් කළ ආකාරයෙන් ම සෆා හා මර්වා අතර සඊ ඉටු කරයි. එහෙත් එම තවාෆ්හි රම්ල් කරන්නේ නැත. එහි දී ඉල්තිබා ක්‍රමයට අඳින්නේ ද නැත. මක් නිසා ද යත් රම්ල් හා ඉල්තිබා පෙර සඳහන් කළ පරිදි සම්ප්‍රාප්ත වීමේ තවාෆයට හැර වෙනත් තවාෆයක ආගමනුකූල කරනු ලබන්නක් නොවන බැවිනි.

පෙර සඳහන් කළ පරිදි තවාෆ්, සඊ, ජම්රාවට ගල් ගැසීම, හිස මුඩු කිරීම හෝ කොට කිරීම යනාදියෙන් පසු දෙවන මිදීම සිදු වේ. ඒ අනුව ඉහ්රාමයට පෙර තත්ත්වයේ ඔහුට අනුමත කර තිබුණු සියලු දෑ බිරිය සමග ලිංගික හැසිරීම ඇතුළු ව ඔහුට වලංගු වනු ඇත.

අවුරුදු දින සිදු කරනු ලැබිය යුතු වන්දනාවන් සංක්ෂිප්ත වශයෙන් පහත දැක්වේ:

- අකබාවට ගල් විසි කිරීම.
- සත්ත්ව කැපය සිදු කිරීම.
- හිස මුඩු කිරීම හෝ හිසකෙස් කොට කිරීම.
- තවාෆ් හා සඊ

සුන්නාව වනුයේ පහසුකම් ඇත්නම් ඒවා පිළිවෙළට සිදු කිරීම ය. එහෙත් එකකට පෙර එකක් සිදු කළ ද එහි වරදක් නැත.

7- එකොළොස්වන දින හා දොළොස්වන දින මිනාවෙහි රාත්‍රිය ගත කිරීම.

8- මෙම දින දෙකෙහි මධ්‍යාහ්න වේලාවට පසු ජම්රාත් තුනට ගල් විසි කරයි. මක්කාවේ සිට දුරින් පිහිටි ජම්රතුල් ඌලාවෙන් එය පටන් ගෙන එහි දී එකින් පසු එකක් ලෙස ගල්කැට හතක් විසි කරයි. සෑම ගල් කැටයක් සමග ම තක්බීර් පවසයි. එය අවසන් කරගත් පසු සෙනඟ අතුරින් මදක් ඉදිරියට පැමිණ කිබ්ලා දෙසට මුහුණ ලා අත්දෙක ඔසවාගෙන තමන් කැමති දෑ දිගු වේලාවක් උත්තරීතර අල්ලාහ්ගෙන් අයැද සිටියි. පසු ව දෙවන ජම්රාව (ජම්රතුල් වුස්තා) වෙත ගල් විසි කරයි. ඉන්පසු ද පළමු අවස්ථාවේ සිදු කළාක් මෙන් ම ප්‍රාර්ථනාව සඳහා සිට ගනියි. පසු ව අවුරුදු දින ගල් ගැසූ තුන්වන ජම්රාව වන ජම්රතුල් අකබාවට ගල් ගසයි. එහි ද මීට පෙර ජම්රාත් දෙකට ගල් ගැසුවාක් මෙන් ම ගල් ගසයි. එහෙත් ඉන් පසු ප්‍රාර්ථනාව සඳහා නතර නොවෙයි.

9- දොළොස් වන දින ජම්රාත් තුනට ම ගල් ගසා සම්පූර්ණ කළ විට, ඔහු කැමති නම් දහතුන්වන දින දක්වා මිනාවෙහි රැඳී සිට මධ්‍යාහ්න කාලයෙන් පසු

එහි ජම්රාත් වලට ගල් ගසනු ඇත. එය වඩාත් උතුම් ක්‍රියාවකි. මක් නිසා ද යත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එසේ සිදු කර ඇති බැවින් හා එහි අමතර ලෙස දැහැමි ක්‍රියාවන් පවතින බැවිනි. එසේ ම ඔහු කැමති නම් දින දෙකකින් පසු කල් ඇති ව එනම් දොළොස්වන දින හිරු අවරට යාමට පෙර මිනාවෙන් පිටත් ව යයි.

එම දිනවල හා රාත්‍රි කාලයන්හි තක්බීර් (අල්ලාහ් ව ශ්‍රේෂ්ඨත්වයට පත් කිරීම) හා දික්ර් (අල්ලාහ්ව මෙනෙහි කිරීම) වැඩි වැඩියෙන් සිදු කළ යුතු ය. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

﴿...وَٱذۡكُرُواْ ٱللَّهَ فِيٓ أَيَّامٖ مَّعۡدُودَٰتٖۚ...﴾ [البقرة:203]

"තව ද නියමිත දින ගණනක් තුළ නුඹලා (මිනාවෙහි රැඳී සිට) අල්ලාහ් ව සිහිපත් කරනු." (අල්-බකරා: 203)

තව ද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කර ඇත්තාහ:

﴿ أَيَّامُ التَّشْرِيقِ أَيَّامُ أَكْلٍ وَشُرْبٍ وَذِكْرِ ٱللَّهِ ﴾

"අය්යාමුත් තෂ්රීක් (අවුරුද්දෙන් පසු ඇති දින තුන) යනු අනුභව කරන, හෙවත් හජ් පානය කරන එමෙන් ම අල්ලාහ් ව සිහිපත් කරන දිනයන් වේ." [1]

---

[1] ඉමාම් මුස්ලිම්තුමා 'කිතාබුස් සියාම්' (උපවාසය) යන පාඩමෙ 'තහ්රීමු සව්මි අය්යාමිත් තෂ්රීක්' (හජ් මස 11,12,13) දිනවල උපවාස තහනම්' යන

මේ සමඟ හජ් වන්දනා කටයුතු සම්පූර්ණ වේ.

## 'තවාෆුල් වදා' හෙවත් සමුගැනීමේ තවාෆය.

හජ්හි කටයුතු සියල්ල හජ් වන්දනාකරු අවසන් කර නැවත ඔහු තම ගම රට බලා හැරී යන්නට අපේක්ෂා කළ විට දේව ගෘහයේ තවාෆුල් වදා (සමුගැනීමේ තවාෆය) ඉටු කරන තෙක් මක්කාවෙන් පිටත් ව නොයා යුතු ය. තම ගමනේ අවසන් කටයුත්ත බවට එය පත් කර ගත යුතු ය.

ඔසප් කාන්තාවට හා පශ්චාත් දරු ප්‍රසූතියෙන් පසු රුධිර වහනය වන කාන්තාවට තවාෆුල් වදා වලංගු නැත. එය ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා ප්‍රකාශ කළ නබි වදනක් අනුව ය. "(හජ් වන්දනාවේ නිරත වූ) ඔවුන්ගේ අවසන් ගනුදෙනුව දේව ගෘහය සමග විය යුතු බව මිනිසුනට නියෝග කරන ලදී. එහෙත් ඔසප් කාන්තාවකට සහන සලසන ලදී."[1]

---

මාතෘකාවේ අංක (1141) යටතේ වාර්තා කර ඇත. මෙය නබීෂා අල් හුද්ලී විසින් ප්‍රකාශ කරන ලද හදීසයකි.

[1] ඉමාම් බුහාරි විසින් 'කිතාබුල් හජ්' හජ් වන්දනාව නම් පාඩමේ. 'තවාෆුල් වදා' (සමුගැනීමේ තවාෆය) නම් මාතෘකාවේ 1755 දරන හදීස් අංකය යටතේ මෙය වාර්තා කර ඇත. ඉමාම් මුස්ලිම් විසින් 'කිතාබුල් හජ්' හජ් වන්දනාව නම් පාඩමේ. 'වුජූබු තවාෆිල් වදා' (සමුගැනීමේ තවාෆය අනිවාර්ය ය) නම් මාතෘකාවේ (380/1328) දරන හදීස් අංකය යටතේ මෙය වාර්තා කර ඇත.

## ඉහ්රාම් තත්ත්වයේ දී තහනම් කරන ලද කරුණු

ඉහ්රාම් තත්ත්වයේ දී තහනම් කරන ලද කරුණු යනු ඉහ්රාම් පැලඳ ගැනීම හේතුවෙන් එම කාලය තුළ තහනම් කරනු ලැබූ කරුණු වේ.

එය පහත සඳහන් පරිදි සාරාංශගත කළ හැකි ය:

**1- හිස මුඩු කිරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ හිසකෙස් ඉවත් කිරීම,** බහුතර විද්වතුන් ඒ සමග ශරීරයේ අනෙකුත් රෝම ද ඇතුළත් කර ඇත.

**2- අත් හා පාදවල නියපොතු කපා ඉවත් කිරීම.** බහුතර විද්වතුන් අනෙකුත් රෝම ඉවත් කිරීම ද එයට ඇතුළත් කර ඇත.

**3- ඉහ්රාම් තත්ත්වයට පැමිණීමෙන් පසු** ශරීරයට හෝ ඇඳුමට හෝ ආහාර පාන ගන්නා දෑට සුවඳ විලවුන් භාවිත කිරීම.

**4- අත් දෙක ආවරණය කරන** අත්වැසුම් පැලඳීම.

**5- කාමුක හැඟීමකින්** වැලඳ ගැනීම.

මෙම තහනම් කරන ලද කරුණු සඳහා වූ ප්‍රතිකර්මය, තෝරා ගැනීමේ නිදහස මත පිහිටා ඇත. හිස මුඩු කිරීම සම්බන්ධයෙන් උත්තරීතර අල්ලාහ් අල් කුර්ආනයේ සඳහන් කර ඇති පරිදි සෙසු දෑ ද ඒ අනුව සසඳනු ලැබේ. එනම් දින තුනක් උපවාසය කිරීම හෝ

දිළිඳුන් සය දෙනෙකුට ආහාර සැපයීම ය. සෑම දිළිඳෙකු සඳහා ම සාඃ එකකින් අඩක් (කිලෝ ග්‍රෑම් 1.20) ප්‍රමාණයක් විය යුතු ය. එසේ නැතහොත් එළුවකු කපා හැරිය යුතු ය. ආහාර හා එළුවා දිළිඳුන් අතර බෙදා හරිනු ලැබේ. එය මක්කාවේ හෝ තහනම් කරුණ සිදු වූ ස්ථානයේ හෝ සිදු කළ යුතු ය.

**6- සංසර්ගයේ යෙදීම**, හජ්හි ඉහ්රාමයෙන් මිදීමේ පළමු අවස්ථාවට පෙර මෙවන් කටයුත්තක නිරත වූ විටෙක ඔහු කෙරෙහි කරුණු හතරක් පෙළ ගැසෙනු ඇත.

ලිංගික ව හැසුරුණු හේතුවෙන් එම වන්දනාව අවලංගු වන්නේය. (එහෙත්) එහි (ගමනේ) දිගට ම රැඳී සිටිය යුතු යි. ලබන වසරේ එය (හජ් වන්දනාව) නැවත ඉටු කළ යුතු යි. වන්දිය ලෙස ඔටුවකු කපා හැර මක්කාවේ හෝ සංසර්ගයේ නිරත වූ ප්‍රදේශයේ වෙසෙන දුප්පතුන් අතර ඒවා බෙදා හැරිය යුතු යි.

**7- විවාහ ගිවිසුම**: මෙහි දී වන්දියක් නැති නමුත් විවාහය වලංගු වන්නේ නැත. ඉහ්රාම්හි සිටින තැනැත්තා මනමාලයා වුව ද මනමාලිය වුව ද භාරකරු වුව ද විවාහය සිදු කිරීමට පවරන ලද නියෝජිතයෙකු වුව ද එක සමාන ය.

**8- ගොඩබිම් කැලෑ සතුන් දඩයම් කර මරා දැමීම.** එහි දී ඔහු වන්දි ගෙවිය යුතු වේ. ඒ හා සමාන සතෙකු

ඔහු කපා හැර, හරම් තුළ සිටින දිළිඳුන් අතර බෙදා හැරිය යුතු ය. එසේ නැතහොත් එය ආහාරයට මිල කර එම ආහාරය හරම් තුළ වෙසෙන දිළිඳුන් අතර බෙදා හැරිය යුතු ය. එසේත් නැතහොත් සෑම දුප්පතෙකු සඳහා ම ආහාර සැපයීම වෙනුවට සපයන ආහාර ප්‍රමාණය අනුව එකකට එක් දිනක් බැගින් උපවාසයේ නිරත විය යුතු ය.

තහනම් කරන ලද මෙම කරුණු අට ඉහ්රාම් තත්ත්වයේ සිටින පිරිමියෙකු හෝ වේවා කාන්තාවක හෝ වේවා ඒ සෑම කෙනෙකුට ම තහනම් වේ. පහත සඳහන් තහනම් කරුණු පිරිමියාට පමණක් සුවිශේෂී වේ.

**1- හිසට ඇලෙන දෙයකින් හිස ආවරණය කිරීම.** කූඩාරමක්, වාහනයක වියනක් හෝ කුඩයක් වැනි හිසට නොඇලෙන දෙයකින් හිස ආවරණය කිරීමෙහි වරදක් නැත.

**2- මසා නිම කළ ඇඳුම් ඇඳීම,** ශරීරයේ ප්‍රමාණයට හෝ ඉන් කොටසකට හෝ ශරීර අවයව අතුරින් එක් අවයවයකට මහන ලද කමිසය, කලිසම, මේස් සපත්තු වැනි සියලු දෑ මෙහි ඇතුළත් වේ. ඉරුණු තැන් මැසූ යටි සළුව හා උඩු සළුව වනාහි එහි වරදක් නැත. එමෙන් ම මුදු, ඔරලෝසු, ඇස් කණ්ණාඩි, ශ්‍රවයාධාර පලඳනා, මුදල් පසුම්බ යනාදියෙහි ද වරදක් නැත.

**පහත සඳහන් තහනම් කරුණු කාන්තාවට පමණක් සුවිශේෂී වේ.**

කවර හෝ ආකාරයකින් මුහුණ ආවරණය කිරීම, ඇයට නිකාබය පමණක් තහනම් බව ඇතැම් විද්වත්හු පවසති. එනම් ඇගේ ඇස්දෙකින් බැලීම සඳහා සිදුරු කරන ලද පොරෝණයකින් මුහුණ වැසීම ය. වඩාත් උචිත වනුයේ පිටස්තර පිරිමින් ඇය දෙස බලන අවස්ථාවක හැර පොදුවේ ආවරණය නොකිරීම ය. එසේ බලන අවස්ථාවක ඉහ්රාම් තත්ත්වයේ වුව ද වෙනත් අවස්ථාවක වුව ද එය ආවරණය කිරීම අනිවාර්ය වේ.

මෙසේ සුවිශේෂී වූ තහනම් කරන ලද කරුණු සඳහා දිය යුතු වන්දිය ඉහත සඳහන් කළ කරුණු පහ සඳහා දෙනු ලබන වන්දිය හා සමාන ය. එහි දී තෝරා ගැනීමේ නිදහස ඇත.

## තහනම් කරන ලද මෙම කරුණු සිදු කරන්නාගේ නීතිය.

ඉහත සඳහන් තහනම් කරන ලද කරුණු සිදු කරන්නාට අවස්ථා තුනක් ඇත:

**පළමු අවස්ථාව:** අවශ්‍යතාවක් හෝ නිදහසට සාධාරණ හේතුවක් හෝ නොමැති ව සිදු කිරීම. ඔහු පාපියෙක් වේ. ඒ සඳහා ඔහු වන්දි ලබා දිය යුතු ය.

**දෙවැන්න:** යම් අවශ්‍යතාවක් සඳහා එය සිදු කිරීම. එවිට ඔහු පාපියෙකු නොවන නමුත් ඔහු වන්දි පිරිනැමිය යුතු ව ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:

﴿...فَمَن كَانَ مِنكُم مَّرِيضًا أَوْ بِهِۦٓ أَذًى مِّن رَّأْسِهِۦ فَفِدْيَةٌ مِّن صِيَامٍ أَوْ صَدَقَةٍ أَوْ نُسُكٍ...﴾ [البقرة:196]

"...එහෙත් නුඹලා අතුරින් කවරෙක් (හිස මුඩු කිරීමට සිදු වූ අවස්ථාවේ) රෝගියෙකු ව හෝ තම හිසෙහි තමන්ට වේදනාවක් සහිත ව සිටියේ නම් හෝ එවිට උපවාසයේ නියැළීමෙන් හෝ දානයකින් හෝ සත්ත්ව කැප කිරීමකින් හෝ වන්දියක් ලබා දිය යුතු ය." (අල්-බකරා: 196)

අධික සීතල හෝ උෂ්ණත්වය හේතුවෙන් යම් අනතුරක් සිදු වනු ඇතැ යි බිය වූ අවස්ථාවක ඔහුගේ හිස ආවරණය කිරීමට අවශ්‍ය වූයේ නම්, එසේ

ආවරණය කිරීම ඔහුට අනුමත නමුත් ඉහත සඳහන් වන්දි අතර තෝරා ගැනීම හා එය ලබා දීමේ නිදහස ඔහු මත පැවරෙන්නේය.

**තුන්වැන්න:** නොදැනුම්වත්කම හෝ අමතක වීම හෝ බල කිරීම හෝ නින්ද යෑම යනාදී නිදහසට කරුණු තිබිය දී එය සිදු කිරීම. ඔහු කෙරෙහි පාපයක් ඇති වන්නේ නැති අතර වන්දි ගෙවීමට ද අවශ්‍ය වන්නේ නැත. එය උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය පදනම් කර ගනිමිනි. එනම්:

﴿...رَبَّنَا لَا تُؤَاخِذۡنَآ إِن نَّسِينَآ أَوۡ أَخۡطَأۡنَاۚ...﴾ [البقرة:286]

(...අපගේ පරමාධිපතියාණනි, අපි -යමක්- අමතක කළෙමු නම් හෝ අපි වරදක් කළෙමු නම් හෝ අප ව දඬුවමට ග්‍රහණය නොකරනු මැනව!...) (අල්-බකරා: 286)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්‍රකාශයක මෙසේ සඳහන් වේ.

﴿إِنَّ اللَّهَ تَجَاوَزَ عَنْ أُمَّتِي الْخَطَأَ وَالنِّسْيَانَ وَمَا اسْتُكْرِهُوا عَلَيْهِ﴾

"මාගේ සමූහයා විසින් සිදුවන අත්වැරදීම්, අමතක වීම් හා ඔවුහු යමක් කෙරෙහි බලකරනු ලැබූහ නම් එයට ද අල්ලාහ් ඔවුනට සමාව දී ඇත්තේය."[1]

---

[1] ඉබ්නු මාජාතුමා 'කිතාබුත් තලාක්' පාඩමේ 'තලාකුල් මුක්‍රිහි වන්-නාසී' (බල කරනු ලබන්නාගේ හා අමතක ව සිදු කරන්නාගේ දික්කසාදය) යන

එහෙත් නිදහසට පිහිටි කරුණ ඉවත් වී තහනම් කරන ලද දෑ ගැන වටහා ගත්තේ නම් හෝ එය මතක් වූයේ නම් හෝ බලකිරීම ඉවත් වූයේ නම් හෝ නින්දෙන් අවදි වූයේ නම් හෝ තහනම් කරන ලද එම දැයින් ක්ෂණික ව ඉවත් විය යුතුයි.

## 'මස්ජිදුන් නබවි' හෙවත් නබිතුමාණන්ගේ මස්ජිදය බැහැ දැකීම.

'අල්-මස්ජිදුන් නබවි' යනු වන්දනා ගමන් යෑමට අවසරය ඇති දේවස්ථාන තුන අතුරින් එක් ස්ථානයකි. එම ස්ථාන තුන නම්: මක්කාවේ පිහිටි 'අල්-මස්ජිදුල් හරාම්', මදීනාවෙහි පිහිටි 'අල්-මස්ජිදුන් නබවී' හා කුද්ස් හි පිහිටි 'මස්ජිදුල් අක්සා' යනාදිය යි. 'අල් මස්ජිදුල් හරාම්'හි හැර 'අල්-මස්ජිදුන් නබවි'හි සලාත් ඉටු කිරීම සෙසු මස්ජිද්වල සලාත් ඉටු කිරීමට වඩා දහස් වාරයකින් උතුම් ය. හජ් සමයේ පමණක් නොව අනෙකුත් සියලු ම වේලාවන්හි එම මස්ජිදයේ සලාත් ඉටු කිරීම සඳහා ඒ වෙත යෑම ආගමානුකූල කර ඇත්තේ එබැවිනි. හජ් හා බැඳුණු යමක් එයට අදාළ වන්නේ නැත. හජ් වන්දනාව ඉන් තොර ව ම සම්පූර්ණ වේ. එය අත්හැරීම හේතුවෙන් හජ්හි අඩුවක් ඇති

---

මාතෘකාවේ අබූ දර්තුමා සහ ඉබ්නු අබ්බාස්තුමා විසින් වාර්තා කර ඇති මෙම හදීසය 2043, 2045 යන හදීස් අංක යටතේ වාර්තා කර ඇත.

වන්නේ නැත. එහෙත් මිනිසුන් හජ් සමග ම එය නියම කර ගන්නේ, ඒ දෙක ම එක ම ගමනින් අවසන් කිරීමට පහසු වන නිසා ය. විශේෂයෙන් ඒ දෙකට ම වෙන වෙනම ගමන් යෑමට අපොහොසත්, දුර බැහැර විදේශකයින් වැනි අය දෙක ම එකට සිදු කර ගනිති.

යමෙකු එම දේවස්ථානයට පිවිසුණු විටෙක තමන් කැමති අයුරින් එහි සලාත් ඉටු කර පසු ව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ දේහය වළ දමා ඇති කබ්ර් ස්ථානයට ගොස් ඒ ඉදිරිපිට සිට ගනිමින් එතුමාණන් වෙත සලාම් හා සලවාත් පවසයි. එය මෙසේ ය:

﴿السَّلَامُ عَلَيْكَ أَيُّهَا النَّبِيُّ وَرَحْمَةُ اللَّهِ وَبَرَكَاتُهُ. اللَّهُمَّ صَلِّ عَلَىٰ مُحَمَّدٍ وَعَلَىٰ آلِ مُحَمَّدٍ كَمَا صَلَّيْتَ عَلَىٰ إِبْرَاهِيمَ وَعَلَىٰ آلِ إِبْرَاهِيمَ إِنَّكَ حَمِيدٌ مَجِيدٌ. وَبَارِكْ عَلَىٰ مُحَمَّدٍ وَعَلَىٰ آلِ مُحَمَّدٍ كَمَا بَارَكْتَ عَلَىٰ إِبْرَاهِيمَ وَعَلَىٰ آلِ إِبْرَاهِيمَ إِنَّكَ حَمِيدٌ مَجِيدٌ﴾.

අහෝ නබිතුමනි, ඔබට සාමය, දයාව සහ දෙවියන් වහන්සේගේ ආශීර්වාදය ලැබේවා. ඒකීය දෙවිඳුනි, ඉබ්රාහීම්තුමා වෙත හා එතුමාගේ පවුලේ ඥාතීන් වෙත ඔබ ආශීර්වාද කළාක් මෙන් ම මුහම්මද්තුමාණන් හා එතුමාණන්ගේ පවුලේ ඥාතීන් හට ආශිර්වාද කරනු මැනව! නියත වශයෙන් ම ඔබ ප්‍රශංසාලාභී ය; කීර්තිය ඇත්තා ය. ඉබ්රාහීම්තුමා වෙත හා එතුමාගේ පවුලේ

ඥාතීන් වෙත ඔබ සමෘද්ධිය ඇති කළාක් මෙන් මුහම්මද්තුමාණන් හා මුහම්මද්තුමාණන්ගේ පවුලේ ඥාතීන් වෙත සමෘද්ධිය ඇති කරනු මැනව! නියත වශයෙන් ම ඔබ ප්‍රශංසාලාබී ය; කීර්තිය ඇත්තා ය.

පසු ව අබූ බක්ර් (රළියල්ලාහු අන්හු) තුමාට සලාම් පැවසීම පිණිස, දකුණු දෙසින් පියවර කිහිපයක් තබා මෙසේ පවසයි:

﴿السَّلَامُ عَلَيْكَ يَا أَبَا بَكْرٍ يَا خَلِيفَةَ رَسُولِ اللَّهِ ﷺ رَضِيَ اللَّهُ عَنْكَ وَجَزَاكَ عَنْ أُمَّةِ مُحَمَّدٍ خَيْرًا﴾

(අහෝ අබූ බක්ර්තුමනි, ඔබට ශාන්තිය අත් වේවා! අහෝ අල්ලාහ්ගේ දූතයාණන්ගේ නියෝජිතය, අල්ලාහ් ඔබ ගැන තෘප්තියට පත් ව (ඔබ ව පිළිගන්නා සේක්වා!) මුහම්මද්තුමාගේ සමූහයා විසින් ඔබට අල්ලාහ් යහපත ආශීර්වාද කරන සේක්වා!)

පසු ව උමර් (රළියල්ලාහු අන්හු) තුමාට සලාම් පැවසීම සඳහා තම දකුණු දෙසින් තවත් පියවරවල් කිහිපයක් තබා සිට ගනිමින් සලාම් පවසයි:

﴿السَّلَامُ عَلَيْكَ يَا أَمِيرَ الْمُؤْمِنِينَ عُمَرُ رَضِيَ اللَّهُ عَنْكَ وَجَزَاكَ عَنْ أُمَّةِ مُحَمَّدٍ خَيْرًا﴾

(අහෝ මුඃමින්වරුන්ගේ නායක උමර්තුමනි, අල්ලාහ් ඔබ ගැන තෘප්තියට පත් ව (ඔබ ව පිළිගන්නා

සේක්වා!) මුහම්මද්තුමාගේ සමූහයා විසින් ඔබට අල්ලාහ් යහපත ආශීර්වාද කරන සේක්වා!)

පසු ව පිරිසිදු තත්ත්වයේ කුබා මස්ජිදයට ගොස් එහි දී සලාත් ඉටු කරයි.

පසු ව 'අල්-බකී' නම් ස්ථානය බැහැදකියි. එය මදීනාවේ මිනී වළ දමා ඇති ස්ථානය යි. එහි දී උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා වෙත සලාම් පවසයි. ඔහුගේ මිනී වළ ඉදිරියේ සිට ගනිමින් මෙසේ පවසනු ඇත:

﴿السَّلَامُ عَلَيْكَ يَا أَمِيرَ الْمُؤْمِنِينَ عُثْمَانُ رَضِيَ اللَّهُ عَنْكَ وَجَزَاكَ عَنْ أُمَّةِ مُحَمَّدٍ خَيْرًا﴾

"(අහෝ මුඃමින්වරුන්ගේ නායක උස්මාන් තුමනි, අල්ලාහ් ඔබ ගැන තෘප්තියට පත් ව (ඔබ ව පිළිගන්නා සේක්වා!) මුහම්මද්තුමාගේ සමූහයා විසින් ඔබට අල්ලාහ් යහපත ආශීර්වාද කරන සේක්වා!)"

තව ද බකීහි වළ දමා ඇති කබ්ර් වාසීන්ට සලාම් පවසයි. ඔවුන් වෙනුවෙන් සමාව හා ආශීර්වාදය අල්ලාහ්ගෙන් ඉල්ලා සිටියි.

තව ද උහද් වෙත යයි. එහි දී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මහප්පෙකු වූ හම්zසා (රළියල්ලාහු අන්හු) තුමාණන්ගේ මිනීවළ හා එහි දී දිවිපිදූවන්ගේ මිනීවළවල් බැහැ දැක ඔවුන් ගැන

තෘප්තියට පත් ව ඔවුන් වෙනුවෙන් සමාව හා ආශීර්වාදය අල්ලාහ්ගෙන් පතයි.

කාන්තාව කබ්ර් ස්ථාන (මිනී වළ දමා ඇති ස්ථාන) බැහැ නොදකියි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ කබ්ර් ස්ථානය හෝ වෙනත් අයගේ කබ්ර් ස්ථාන ඇය විසින් බැහැ දකින්නේ නැත.

අපි මේ සඳහන් කළ දෑ හැර මදීනාවේ පිහිටි දේවස්ථාන හා අනෙකුත් ස්ථාන අරබයා වන්දනා ගමනක් යෑමේ අධිෂ්ඨානයෙන් ගමන් කිරීම ආගමානුකූල කරුණක් නොවේ.

ආශීර්වාද කරන්නා අල්ලාහ්ය, අපගේ නායක මුහම්මද්තුමාණන් හටත් එතුමාණන්ගේ පවුලේ ඥාතීන් හා හිතමිතුරන් සියලු දෙනා හටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදා වේවා!

**මෙම ලිපිය ලියන ලද්දේ, අල්ලාහ් වෙත සරණ පතන**

අෂ් ෂෙයික් මුහම්මද් බින් සාලිහ් අල්උසයිමීන්

විසිනි.

# පටුන

හජ් ඉටුකරන ක්‍රමය ........................................................ 2

ගමන හා බැඳුණු නීති........................................................ 4

හජ් අනිවාර්යය වූයේ කවදා ද? .......................................... 31

හජ් හෝ උම්රා සඳහා ඉහ්රාම් තත්ත්වයට පැමිණිය යුත්තේ කොතැන සිට ද?........................................................ 35

හජ් ඉටු කිරීමට නියම වූ වන්දනා චාරිත්‍ර හා ඒවායෙහි වඩාත් උතුම් දෑ........................................................ 38

තමත්තුඃ ක්‍රමයට හජ් ඉටු කිරීමේ ආකාරය, උම්රා සඳහා ඉහ්රාම් ආරම්භ කිරීමේ සිට හජ් නිමා කරන තෙක් වූ ක්‍රමවේදය කෙටියෙන්. ........................................ 40

'තවාෆුල් වදා' හෙවත් සමුගැනීමේ තවාෆය. ...................... 51

ඉහ්රාම් තත්ත්වයේ දී තහනම් කරන ලද කරුණු ............... 52

තහනම් කරන ලද මෙම කරුණු සිදු කරන්නාගේ නීතිය...56

'මස්ජිදුන් නබවි' හෙවත් නබිතුමාණන්ගේ මස්ජිදය බැහැ දැකීම........................................................ 58

رئاسة الشؤون الدينية
بالمسجد الحرام والمسجد النبوي

# رسالة الحرمين

# Message of The Two Holy Mosques

## Shar'i guidance content for the visitors of the Holy Mosque and the Prophet's Mosque in languages